unit 08-13

# 1947 - සෝල්බරි ආණ්ඩුක්‍රමය

වාගීෂ්වර

- ව්‍යවස්ථාදායකය
- විධායකය
- ස්ථිර විධායකය
- අධිකරණය
- සුළු ජාතීන්ගේ රැකවරණ විධි විධාන
- කැබිනට් ක්‍රමය
- පක්ෂ ක්‍රමය

s u r e k a   w a g e e s h w a r a

# ව්‍යවස්ථාදායකය

# ව්‍යවස්ථාදායකය - පාර්ලිමේන්තුව

පොදු හැඳින්වීම

බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රම සම්ප්‍රදාය අනුගමනය කරමින් 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නිර්මාණය කළ **ව්‍යවස්ථාදායක ආයතනය පාර්ලිමේන්තුවයි**. සෝල්බරි පාර්ලිමේන්තු ආකෘතිය බ්‍රිතාන්‍යය වෙස්ට්මිනිස්ටර් පාර්ලිමේන්තු ආකෘතියට අතිශයින් සාම්‍ය විය. සෝල්බරි ව්‍යවස්ථාදායකය නිර්මාණය වූයේ **ද්වි මාණ්ඩලිකවාදය** මතිනි. සරලව දක්වන්නේ නම් සෝල්බරි ව්‍යවස්ථාදායකය (පාර්ලිමේන්තුව) ද්විමාණ්ඩලික විය.

**I** **නියෝජිත මන්ත්‍රී මණ්ඩලය**

**II** **සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය**

හැඳින්වීම

## ■ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය.

මොකක්ද :

සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව නිර්මාණය කර ඇති ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවේ පළමු සභාව නියෝජිත මන්ත්‍රී මණ්ඩලයයි. **මහජන මන්ත්‍රී මණ්ඩලය - පහළ මන්ත්‍රී මණ්ඩලය** මෙයට සමරූපී නාමකරණයන් වේ.

පාර්ලිමේන්තුවේ ප්‍රමුඛ ආයතනය වන්නේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයයි. ඊට අදාළ හේතු, සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුව ලෙසින් අර්ථකතනය කරනු ලැබුවේ **නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වීම - කැබිනට් මණ්ඩලය විසින් සාමූහිකව වග කීමට බැඳී සිටින්නේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වීම - ආණ්ඩුවට ශක්තිය හා බලය සපයන ආයතනය වීම - අගමැති හා කැබිනට් මණ්ඩලය මේ තුළින් තෝරා ගැනීම - ජනතා නියෝජිතයන්ගෙන් සමන්විත වීම.**

සංයුතිය (සාමාජිකයන්/ පත්කිරීම)

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සමන්විය යුතු සාමාජික සංඛ්‍යාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිශ්චිත ලෙස දක්වා තිබුණේ නැත. **ජන සංගණනයකට** පසුව සාමාජික සංඛ්‍යාව තීරණය කළ යුතු යැයි ව්‍යවස්ථාවේ සඳහන් විය. එම නිසා **මුල් අවධිය** තුළ මන්ත්‍රීවරු 101 ක් ද **පසු කාලය** තුළ මන්ත්‍රීවරු 157 ක් ද මෙයට තේරී පත්විය. **මෙම මන්ත්‍රී වරුන් තෝරාගන්නේ ප්‍රධාන ක්‍රම දෙකකට ය.**

**I ක්‍රමය** - මන්ත්‍රීවරු හයක් (6) අග්‍රාණ්ඩුකාරවරයා විසින් අගමැතිගේ උපදෙස් මත පත්කරයි. මෙම පත් කිරීම් සුළු ජාතීන්ට නියෝජනයක් ලැබෙන සේ සිදු කරයි.

**II** ක්‍රමය - ඉතිරි සාමාජිකයන් ජනතාව විසින් ඡන්ද කොට්ඨාශ වලින් තෝරා ගනී. ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම ප්‍රධාන සාධක දෙකක් මත පදනම් වී සිදු කරන ලදි. **වර්ග සැතපුම් 1000 ට එක් ආසයනයක් ද - ජනගහනය 75000 ට එක් ආසනයක් ද** යන ආකාරයට එම ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කළේ ය. සරල බහුතර නියෝජනක්‍රමය භාවිතා විය.

**මුල් අවධිය තුළ (1947 - 1959)**

**101**

**95** - ජනතාව විසින් ඡන්ද කොට්ඨාස වලින් තෝරාපත් කරයි.

(සරල බහුතර නියෝජන ක්‍රමය)

**06** - ආණ්ඩුකාරවරයා විසින් අගමැතිගේ උපදෙස් මත තෝරා පත් කරයි.

අරමුණු -: සුළු ජාතීන්තට නියෝජනයක් ව්‍යවස්ථාදායකය තුළ ලබා දීම.

**පසු අවධිය තුළ (1960 - 1972)**

**157**

**151** - ජනතාව විසින් ඡන්ද කොට්ඨාස වලින් තෝරාපත් කරයි.

(සරල බහුතර නියෝජන ක්‍රමය)

**06** - ආණ්ඩුකාරවරයා විසින් අගමැතිගේ උපදෙස් මත තෝරා පත් කරයි.

අරමුණ -: සුළු ජාතීන්තට නියෝජනයක් ව්‍යවස්ථාදායකය තුළ ලබා දීම.

**N.B** -: **ඡන්ද කොට්ඨස බෙදා වෙන් කිරීමේ දී භාවිත කරන මූලධර්ම දෙකකි.**

(i) **වර්ග සැතපුම් 1000 ට එක් ආසනයක් වෙන් කිරීම.**
(ii) **ජනග්‍රහනය 75000 එක් ආසයක් වෙන් කිරීම.**

නිල කාලය — නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ නිලකාලය වසර 5 කි. කලින් විසුරුවා හැරියහොත් මිස නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සම්පූර්ණ ධූරකාලය බලපැවැත්විණි.

වෙනත් — නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සභාපති වරයා වන්නේ කථානායකවරයාය. මහ මැතිවරණයකට පසුව රැස්වන නියෝජිත මන්ත්‍රීමණ්ඩලයේ ප්‍රථම කාර්ය වූයේ **කථානායකවරයකු - නියෝජ්‍ය කථානායකවරයෙකු සහ නියෝජ්‍ය කාරකසභා සභාපතිවරයෙකු** තෝරාපත් කර ගැනීමයි.

● කාර්ය හා බලතල.

(i) වයවස්ථාදායක අංශයේ කාර්ය හා බලතල.

ව්‍යවස්ථාදායක සභාවක් ලෙස නීති සම්පාදනය කිරීමට බලතල ඇත. **මුදල පනත් හා සාමාන්‍ය පනත්** ආරම්භ කිරීම සම්බන්ධයෙන් බලතල තිබුණි. මුදල් පනත් ආරම්භ කිරීමට බලතල ඇති එකම සභාව මෙය වේ. තවදුරටත්, සෙනට් සභාව විසින් ආරම්භ කරන ලද සාමාන්‍ය පනත් කෙටුම් පතක් **සම්මත කිරීමට - සංශෝධනය කිරීමට - කල් දැමීමට - ප්‍රතික්ෂේප කිරීමට** බලය නියෝජිත මන්ත්‍රීමණ්ඩලය සතුය.

(ii) විධායක අංශයේ කාර්ය හා බලතල.

සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව දේශපාලන විධායකය කැබිනට් මණ්ඩලයයි. කැබිනට් මණ්ඩලය තෝරාගනු ලබන්නේ ව්‍යවස්ථාදායකයේ විශේෂයෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුළිනි. එම නිසා පාලන කටයුතු සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායකයට විශේෂයෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට සාමූහික වගකිව යුතු ය. එසේ වග නොකියන විට නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුළ සම්මත කරනු ලබන විශ්වාසභංග යෝජනාවක් මගින් කැබිනට් මණ්ඩලය ඉවත් කිරීමට නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට හැකිය. **එම නිසා සෘජුව විධායකය පාලනයට හා මෙහෙය වීමට නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට හැකිය.**

**තවදුරටත්,**

ප්‍රශ්න විචාරීම - විවේචනය කිරීම - චෝදනා කිරීම - තර්ජනය කිරීම - ආයාචනා කිරීම - දුක්ගැනවිලි ඉදිරිපත් කිරීම - මහජන මතය ඉදිරිපත් කිරීම වැනි **වක්‍ර ක්‍රියාමාර්ග** මගින් ද විධායකය පාලනයට හා මෙහෙය වීමට නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට හැකිය.

(iii) මූල්‍යමය බලතල

පාලන කටයුතු සඳහා ආණ්ඩුවට (කැබිනට් මණ්ඩලයට) අවශ්‍ය මුදල් ලබා ගැනීමට සිදු වන්නේ ව්‍යවස්ථාදායකය තුළිනි. එම මුදල් වියදම් කළ යුත්තේ ද ව්‍යවස්ථාදායකයේ අනුමැතිය මතය - මුදල් පනත් ආරම්භ කිරීමට බලය ඇත්තේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට පමණි. මෙවැනි තත්ත්වයක් මත විශාල මූල්‍යමය බලතල ප්‍රමාණයක් නියෝජිත මන්ත්‍රී මණ්ඩලය භුක්ති විඳී.

(iv) **මහජන දුක්ගැනවිලි, අවශ්‍යතාවයන් සොයා බැලීම.**

(v) **මන්ත්‍රීවරු පුහුණු කිරීම.**

(vi) **රාජාසන කථාව අනුමත කිරීම.**

(vii) **විධායකයට අවශ්‍ය බහුතරය සැපයීම.**

## ■ සෙනෙට් සභාව.

හැඳින්වීම

මොකක්ද :

සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පිහිටුවා ඇති ව්‍යවස්ථාදායකය පාර්ලිමේන්තුවේ දෙවන සභාව සෙනෙට් සභාවයි. මෙම සභාව **උත්තර මන්ත්‍රී මණ්ඩලය - ඉහළ මන්ත්‍රී මණ්ඩලය** යන නාමකරණයන්ගෙන් ද හඳුන්වයි.

සංයුතිය (සාමාජිකයන්/ පත්කිරීම)

සෙනෙට් සභාවේ සාමාජිකයන් 30 කි. එම සාමාජිකයන් **ආකාර දෙකකට තෝරාගනී.**

**I** ක්‍රමය -: 15 ක් අග්‍රාණ්ඩුකාරවරයා විසින් අගමැතිගේ උපදෙස් මත පත්කරයි.මෙසේ පත් කිරීමේ අරමුණ වූයේ උගතුන් බුද්ධිමතුන් ව්‍යවස්ථාදායකයට ඇතුල් කර ගැනීමයි. අධ්‍යාපනය - නීතිය - වෛද්‍ය - විද්‍යාව - ඉංජිනේරු - බැංකු කෘෂිකර්මය - වානිජ - රාජ්‍ය සේවය - මහජන සේවය කළ අය පත් කිරීමට උත්සාහ ගත

යුතු යැයි ව්‍යවස්ථාවේ සඳහන් විය.

**II** ක්‍රමය -: 15 ක් නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුළ නියෝජනය වන දේශපාලන විසින් තෝරා ගනී.

30

15 — අග්‍රාණ්ඩුකාරවරයා විසින් අගමැතිගේ උපදෙස් මත පත් කරයි

15 — නියෝජ්‍ය මන්ත්‍රී මණ්ඩලය තුළ ඇති දේශපාලන පක්ෂ විසින් පත් කරයි.

පිහිටුවීමට හේතු කිහිපයකි.

**මෙම සෙනෙට් සභාව නිර්මාණය කිරීමට අදාළව බලපෑ හේතු සාධක කිහිපයකි.**

- නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සම්මත කරන පනත් කෙටුම්පත් නැවත සලකා බැලීම.
- උගතුන් බුද්ධිමතුන් දේශපාලන කටයුතු වලට සම්බන්ධ කර ගැනීම.
- සුළු ජාතීන්ට නියෝජනයක් ලබා දීම.
- ජනතාවගේ දේශපාලන දැනුම වර්ධනය කිරීම.
- වෙනත් රටවල පවතින දෙවැනි මණ්ඩල ක්‍රමය ආදර්ශයට ගැනීම.

නිලකාලය

සෙනෙට් සභාව එකවර විසිරී නොයන අඛණ්ඩව ක්‍රියාත්මක වන ස්ථාවර සභාවකි. වසර දෙකකට වරක් සභාවෙන් 1/3 ක් ඉවත්වන අතර ඒ සඳහා අලුතින් 1/3 ක් තෝරා ගනී. **එක් සාමාජිකයෙකු වසර හයක ධූරකාලයක් ධූර දරයි.**

● <u>කාර්ය හා බලතල.</u>

(i) <u>ව්‍යවස්ථාදායක අංශයේ කාර්ය හා බලතල.</u>

ව්‍යවස්ථාදායක සභාවක් ලෙස නීති සම්පාදනය කිරීමට බලතල ඇත. එය කොටස් දෙකක් යටතේ අධ්‍යයනය කළ යුතු ය.

- මුදල් පනත් කෙටුම්පත්
- මුදල් නොවන පනත් කෙටුම්පත් (සාමාන්‍ය පනත් කෙටුම්පත්)

**මුදල් කෙටුම්පත් ආරම්භ කිරීමට බලතල සෙනෙට් සභාවට නැත.** නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කොට සෙනෙට් සභාවේ අනුමැතිය සඳහා එවන ලද මුදල් පනතක් **සම්මත කිරීමට - එම සභාවේ අනුමැතිය මත සංශෝධනය කිරීමට - එක් මසක් රඳවා තබා ගැනීමට (කල් දැමීමට) හැකිය - ප්‍රතික්ෂේප කළ නොහැකිය.** මුදල් පනතක් සම්බන්ධයෙන් අවම බලතල සෙනෙට් සභාව සතු වේ.

**සාමාන්‍ය පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් බලතල සෙනෙට් සභාව සතු වේ.** සාමාන්‍ය පනත් කෙටුම්පත් ආරම්භ කළ හැකිය. නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් **සම්මත කොට සෙනෙට් සභාවේ අනුමැතිය සඳහා එවන ලද සාමාන්‍ය පනත් කෙටුම් පතක් සම්මත කිරීමට - එම සභාවේ අනුමැතිය ලැබේනම් සංශෝධනය කිරීමට - මාස හයක් (6) රඳවා තබා ගැනීමට (කල් දැමීමට) හැකිය - ප්‍රතික්ෂේප කළ නොහැකිය.**

(ii) <u>විධායක අංශයේ කාර්ය හා බලතල.</u>

- <u>විධායකය වන කැබිනට් මණ්ඩලයට සාමාජිකයන් තෝරා ගැනීමේ දී සෙනෙට් සභාව තුලින් ද ඒ සඳහා සාමාජිකයන් තෝරා ගනී.</u> අවම වශයෙන් ඇමතිවරු දෙදෙනෙක් (2) වත් තෝරා ගත යුතු යැයි සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වේ. එම නිසා සෙනෙට් සභාවට විධායක අංශයේ කාර්ය හා බලතල හිමි වේ.
- <u>විධායකය වන කැබිනට් මණ්ඩලය ඍජුව පාලනයට හා මෙහෙය වීමට සෙනෙට් සභාවට නොහැකිය.</u> නමුත් ප්‍රශ්න කිරීම - විවේචනය කිරීම - විවාද පැවැත්වීම - චෝදනා කිරීම වැනි වක්‍ර ක්‍රම හරහා විධායකය වන කැබිනට් මණ්ඩලය කිසියම් ප්‍රමාණයකට පාලනයට හා මෙහෙය වීමට සෙනෙට් සභාවට හැකිය.

(iii) <u>අධිකරණ අංශයේ බලතල.</u>

අධිකරණ අමාත්‍ය වරයා චාන්සලර් සාමි වරයා පත් කළ යුත්තේ සෙනෙට් සභාව තුළිනි. විනිශ්චයකරුවන් ඉවත් කිරීමට සෙනෙට් සභාවේ අනුමැතිය අවශ්‍ය වීම.

■ නාමික විධායකය ද ඇතුලත් වේ.

සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ව්‍යවස්ථාදායකයට නාමික විධායකය **අග්‍රාණ්ඩුකාරවරයා** ද අයත් වේ. පාර්ලිමේන්තුවේ මණ්ඩල දෙක මගින් සම්මත කරන ලද පනත් කෙටුම්පත් නීති බවට පත් වීමට අග්‍රාණ්ඩුකාරවරයාගේ අවසාන අනුමැතිය අවශ්‍ය වේ.

**සෝල්බරි පාර්ලිමේන්තුවේ ස්වාධිපත්‍යය (පරමාධිපත්‍යය)**

- **පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය (පරමාධිපත්‍යය) අර්ථ නිරූපණය.**

**"ස්වාධිපත්‍යය පාර්ලිමේන්තුවක් යනුවෙන් අදහස් කරනු ලබන්නේ වෙනත් ආයතනවල බලපෑමකින් හෝ සීමාවකින් තොරව නීති සම්පදනයට හැකියාව ඇති පාර්ලිමේන්තුවක්ය."**

**"ව්‍යවස්ථාදායකය පාර්ලිමේන්තුවේ අභිමතයට අනුව ඕනෑම නීතියක් සම්පාදනයට - සංශෝධනයට - නිශේධ කිරීමට පාර්ලිමේන්තුව සතු පරම සහ අසීමිත අධිකාරී බලය පාර්ලිමේන්තු පරමාධිපත්‍යය යන්නෙන් සංකේතවත් වේ."**

- **ස්වාධිපත්‍යය නොමැති පාර්ලිමේන්තුවක හඳුනාගත හැකි ලක්ෂණ කිහිපයකි.**

- නීති සම්පාදනය සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයට සමාන හෝ උසස් ආයතන පැවතීම.
- ව්‍යස්ථාදායකයේ නීති සම්පාදන බලය සීමාකරන වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තළ දැක්වීම.
- ව්‍යවස්ථාදායකයේ නීති සම්පාදන බලයට බලපෑම් කිරීමට හැකිවීම.

■ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නිර්මාණය කළ ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුව ස්වාධිපත්‍යය (පරමාධිපත්‍යය) පාර්ලිමේන්තුවක් නොවේ. **නිදර්ශන,**

(i) **නීති සම්පාදන බලයට බලපෑම් පැවතීම.** (අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය)

සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය ක්‍රියාත්මක විය. **අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය යනු ව්‍යවස්ථාදායකය සකස් කරන නීති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලද නැද්ද පරීක්ෂා කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය සතු බලයයි.** මෙම බලය යටතේ **පාර්ලිමේන්තුව සකස් කරන නීති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කරන්නේ නම් එම නීති නිශේධ කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට හැකියාව ඇත.** එම නිසා සෝල්බරි පාර්ලිමේන්තුව ස්වාධිපති (පරමාධිපත්‍යය) ව්‍යවස්ථාදායකයක් ලෙස හඳුනාගත හැකිය.

**(N.B)** *නමුත් අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය සම්බන්ධයෙන් සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ දක්වා නොමැත. දේශපාලන විචාරකයින් ප්‍රකාශ කරනු ලබන්නේ අධිකරණ තීන්දු මගින් මෙවැනි බලයක් අධිකරණය සතු ඇති බවයි. නමුත් ඇතැම් විචාරකයින් එම මතය ප්‍රතික්ෂේප කරයි.*

(ii) **නීති සම්පාදන බලයට සීමාවන් පැවතීම.** (29 (2) - 29(3) )

සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පාර්ලිමේන්තුවේ නීති සම්පාදන බලයට සීමාවන් පනවා තිබුණි. <u>29 (2) උපවගන්තිය මගින් දක්වා තිබුණේ</u> **කිසියම් ආගමකට - වර්ගයකට ජන කණ්ඩායමකට වරප්‍රසාද දෙන නීති පාර්ලිමේන්තුවට සම්පාදනය කළ නොහැකි බවයි.** මෙම නීතිය <u>29(3) උපවගන්තිය</u> මගින් තවදුරටත් ශක්තිමත් කර තිබුණි. **එමගින් ප්‍රකාශිත වන්නේ පාර්ලිමේන්තුව එවැනි නීතියක් සකස් කරන්නේ නම් එය ස්වයං ක්‍රියවම නිශේධනය වන බවයි.**

> **29 (2) උපවගන්තිය - 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.**
>
> (අ) කවර ආගමක් වුවද නිදහසේ ඇදහීම තහනම් කිරීම හෝ සීමා කිරීම නොකළ යුතුය; **නැතහොත්**
>
> (ආ) කවර ජන සමූහයක් හෝ ආගමික පුද්ගලයන් අනෙකුත් ජන සමූහවල හෝ ආගම් වල හෝ පුද්ගලයන් පාත්‍ර නොවූ දුෂ්කරතාවන්ට හෝ සීමාවන්ට පාත්‍ර නොකළ යුතුය; **නැතහොත්**
>
> (ඇ) කවර ජන සමූහයක හෝ ආගමික පුද්ගලයන්ට නොපැවරූ වරප්‍රසාද හෝ පහසුකමක් අනෙකුත් ජන සමූහවල හෝ ආගම් වලට අයත් පුද්ගලයන්ට නොපැවරිය යුතු ය. **නැතහොත්**
>
> (ඈ) කිසියම් ආගමක සංස්ථාවක ව්‍යවස්ථාවක් එහි පාලක මණ්ඩලයේ අනුමැතිව ඇතිව මිස වෙනස් නොකළ යුතු ය. එයත් යම් කිසි ආගමික සංස්ථාවක් නීති මගින් සංස්ථාපනය කර ඇති කල්හි එහි පාලක මණ්ඩලයේ ඉල්ලීමක් අනුව මිස වෙනස් නොකළ යුතු ය.

> **29 (3) උප වගන්තිය - 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**
>
> 29 වෙනි වගන්තියේ (2) වෙනි උප වගන්තියෙන් දැක්වූ විධිවිධානයන්ට පටහැනිව පනවන පනත් නිෂ්ප්‍රභා වන්නේ ය.

(iii) **නීති සම්පාදනය සඳහා පාර්ලිමේන්තුවට අමතරව වෙනත් ආයතන පැවතීම.**
**(1947 ලංකා ස්වාධීන ආඥාපනතේ I වගන්තියේ (I) උප වගන්තිය)**

<u>සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ නීති සම්පාදනය සඳහා ලංකාවේ පාර්ලිමේන්තුවට අමතරව වෙනත් ආයතන පිහිටුවා තිබුණි.</u> **1947 ලංකා ස්වාධීන අඥා පනතේ I වගන්තිය (I) උප වගන්තියට අනුව ලංකවේ අණ්ඩුවේ ඉල්ලීම හෝ කැමැත්ත මත බ්‍රිතාන්‍යය** පාර්ලිමේන්තුවට ලංකාවට අදාළ නීති සම්පාදනයට හැකිය. මෙම තත්ත්වය මත සෝල්බරි පාර්ලිමේන්තුව ස්වාධිපති පාර්ලිමේන්තුවක් ලෙස හැඳින්විය නොහැකිය.

| 1947 - ලංකා ස්වාධීනතා අඥා පනත I පරිච්ඡේදය (I) උපවගන්තිය. |
| --- |
| එක්සත් රාජධානියේ පාර්ලිමේන්තුව විසින් පනවන ලද ව්‍යවස්ථා කෙටුම්පතක් නියම කරගන්නා ලද දිනයේ සිට හෝ ඊට පසුව හෝ ලංකාවේ නීතිය වශයෙන් ක්‍රියාත්මක නොවන අතර එම ව්‍යවස්ථා කෙටුම් පත ලංකාණ්ඩුවේ කැමැත්ත හෝ ඉල්ලීම පරිදි ලංකාවේ නීතියක් වශයෙන් ක්‍රියාත්මක වන්නේ ය. |
| **(N.B)** *මෙයින් අදහස් වනුයේ ලංකාවේ ආණ්ඩුවේ ඉල්ලීම අනුව ලංකා ආණ්ඩුව කෙරෙහි බලපාන නීති සම්පාදනය කිරීමේ බලය එංගලන්ත පාර්ලිමේන්තුවට හිමිවන බවයි. එමෙන්ම සර් අයිවර් ජෙනිංස් දක්වන්නේ ලංකා ආණ්ඩුවේ ඉල්ලීම මත ලංකා ආණ්ඩුක්‍රමය සංශෝධනය සම්බන්ධයෙන් වුවද බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට හැකියාව ඇති බවයි.* |

මෙම ආකාරයට සෝල්බරි පාර්ලිමේන්තුව ස්වාධිපති, පරමාධිපත්‍යය බලය හිමි පාර්ලිමේන්තුවක් නොවේ. එම නිසා එය උත්තරීතර පාර්ලිමේන්තුවක් ලෙස අර්ථකථනය කළ නොහැකිය.

# සෙනෙට් සභාව පිහිටුවීම හා අහෝසි කිරීම.

● <u>සෙනෙට් සභාව හැඳින්වීම.</u>

සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ස්ථාපනය කර ඇති ව්‍යවස්ථාදායක <u>පාර්ලිමේන්තුවේ දෙවන සභාව සෙනෙට් සභාවයි.</u> මෙම සභාව **උත්තර මන්ත්‍රී මණ්ඩලය - ඉහළ මන්ත්‍රී මණ්ඩලය** යන නාමකරණයන්ගෙන් ද හඳුන්වයි.

● <u>සෙනෙට් සභාවේ සංයුතිය.</u>

සෙනෙට් සභාවේ සාමාජිකයින් සංඛ්‍යාව 30 කි. මොවුන් ආකාර දෙකකට තෝරාපත් කර ගනී.

**I** ක්‍රමය -: <u>15 ක් අග්‍රාණ්ඩුකාරවරයා විසින් අගමැතිගේ උපදෙස් මත</u> පත්කරයි. <u>මෙසේ පත් කිරීමේ අරමුණ</u> වූයේ උගතුන් බුද්ධිමතුන් ව්‍යවස්ථාදායකයට ඇතුල් කර ගැනීමයි. එම නිසා අධ්‍යාපනය - නීතිය - වෛද්‍ය - විද්‍යාව - ඉංජිනේරු - බැංකු කාෂිකර්මය - වානිජ - රාජ්‍ය සේවය - මහජන සේවය කළ අය පත් කිරීමට උත්සාහ ගත යුතු යැයි ව්‍යවස්ථාවේ සඳහන් විය.

**II** ක්‍රමය -: <u>15 ක් නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුළ නියෝජනය වන දේශපාලන විසින් තෝරා ගනී</u>.

30

15 — අග්‍රාණ්ඩුකාරවරයා විසින් අගමැතිගේ උපදෙස් මත පත් කරයි

15 — නියෝජ්‍ය මන්ත්‍රී මණ්ඩලය තුළ ඇති දේශපාලන පක්ෂ විසින් පත් කරයි.

● <u>සෙනෙට් සභාවේ සාමාජිකයකු ලෙස තේරී පත්වීමට අවශ්‍ය සුදුසුකම්.</u>

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති ආකාරයට සෙනෙට් සභාවේ සාමාජිකයෙකු ලෙස තේරී පත් වීම සඳහා **වයස අවුරුදු 35 සම්පූර්ණ වීම - නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයකු නොවීම.**

● <u>සෙනෙට් සභාවේ නිලකාලය.</u>

**සෙනෙට් සභාව එකවර විසිර නොයන අඛණ්ඩව ක්‍රියාත්මක වන ස්ථාවර සභාවකි.** වසර දෙකකට වරක් සභාවෙන් 1/3 ක් ඉවත්වන අතර ඒ සඳහා අලුතෙන් 1/3 ක් තෝරා ගනී. **එක් සාමාජිකයකු වසර හයක (6) ධූරකාලයක් ධූරධරයි.**

● සෙනෙට් සභාව **පිහිටුවීම** සහ **අහෝසි කිරීම**ට අදාළ තත්ත්වයන් (හේතු)

**1947** සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවේ දෙවන සභාව බවට පත්ව තිබුණේ සෙනෙට් සභාවයි. නමුත් **1972** ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ස්ථාපනයකරන විට මෙම සභාවේ සභාව අහෝසි කරන ලදි. ඊට අදාළව ඉදිරිපත් කළ තර්කය වන්නේ සෙනෙට් සභාව ස්ථාපනය කිරීමේ දී බලාපොරොත්තු වූ අරමුණු ඉටු නොවීමයි.

## 1. නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සම්මත කරන පනත් කෙටුම්පත් යළි සලකා බැලීම.

**1947 දී පිහිටුවීමට බලපෑ හේතුව :-**

ව්‍යවස්ථාදායකයේ පළමු සභාව නියෝජිත මන්ත්‍රීමණ්ඩලය ඡන්දයෙන් තේරීපත් වූ සභාවකි. එම නිසා තම ඡන්ද දායකයන් තෘප්තිමත් කිරීමේ අරමුණින් හදිසියේ ආවේග හා කැලබීම් මත හොර රහසේ පක්ෂග්‍රාහී ව්‍යවස්ථා පැනවිය හැකිය. එම නිසා එවැනි පනත් කෙටුම්පත් යලි සලකා බැලීමේ අවශ්‍යතාවය සෙනෙට් සභාව පිහිටුවීමට හේතු විය. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම්, පළමු සභාව වන නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හදිසියේ ආවේග හා කැලබීම් මත හොර රහසේ පක්ෂග්‍රාහී නීති සම්පාදනය වැලැක්වීමට සංරෝධකයක් ලෙස දෙවන සභාව පිහිටු විය.

**1972 දී අහෝසි කරන විට ඉදිරිපත් කළ තර්කය :-**

1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමය මගින් සෙනෙට් සභාව අහෝසි කරන විට ප්‍රකාශ කළ අදහස වූයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සම්මත කරන පනත් කෙටුම්පත් යලි සලකා බැලීම අවශ්‍ය නොවන බවයි. ඊට අදාළව ඒ මෙහොතේ ඉදිරිපත් වූ තර්කය වන්නේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට හදිසියේ - අපරීක්ෂාකාරීව - හොර රහසේ නීති සම්පාදනය කිරීමට අවකාශයක් නොමැති බවයි. **පනතක් නීතියක් වීමට** නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුළ තුන්වරක් සාකච්ඡා කළ යුතු ය. නාමික විධායකයේ අනුමැතිය අවශ්‍ය විය. එම නිසා හදිසියේ නීති සම්පාදනය කළ නොහැකිය. නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුළ ආණ්ඩුපක්ෂයේ මෙන්ම විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් සිටී. එම නිසා **අපරීක්ෂාකාරීව නීති සම්පාදනයට** අවකාශය නැත. මාධ්‍ය විසින් පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් පුළුල් ප්‍රචාරණයක් ලබා දෙන නිසා හොර රහසේ නීති සම්පාදනය කිරීමට ද නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට ඉඩක් නැත. මෙම තත්ත්වය මත නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සම්මත කරන පනත් කෙටුම්පත් යලි සලකා බැලීමේ අවශ්‍යතාවයක් නොමැත. සැබෑ ලෙසට සෙනෙට් සභාව විසින් සිදු කර තිබුණේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් ගෙන එන අපරීක්ෂාකාරී පනත් පාලනය කිරීමට නොව නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් ගෙන එන ප්‍රගතිශීලී පනත් පාලනය කිරීමයි.

නිදර්ශන -: 1956 - 1964 අතර කාලය තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගෙන ආ කුඹුරු පනත සමගම් රජයට පවරා ගැනීමේ පනත - බස් ජනසතු කිරීමේ පනත - පාසැල් රජයට පවරා ගැනීමේ පනත වැනි පනත් පාලනය කිරීමට සෙනෙට් මණ්ඩලය ක්‍රියා කිරීම.

## 2. උගතුන් බුද්ධිමතුන් දේශපාලන කටයුතු වලට ඇතුලත් කර ගැනීම.

**1947 දී පිහිටුවීමට බලපෑ හේතුව :-**

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය බල දේශපාලනය හරහා ජනතා ඡන්දයෙන් තේරී පත් වන මණ්ඩලයකි. එම නිසා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට තේරීපත් වන්නේ පක්‍ෂ බල දේශපාලනයේ නියැලෙන පිරිසකි. සෝල්බරි කොමිසමේ අදහස වූයේ උගතුන් - බුද්ධිමතුන් - විවිධ ක්ෂේත්‍රවල දක්‍ෂයින් - කලාකරුවන් - සමාජ සේවකයින් - ලේඛකයන් වැනි සමාජමය වශයෙන් සේවාවක් කළ පිරිසක් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට තේරී පත් නොවන බවයි. එසේ වන්නේ ඔවුන් මැතිවරණ වලට ඉදිරිපත් නොවන නිසාය. එම නිසා උගත් බුද්ධිමත් පිරිසක් ව්‍යවස්ථාදායකයට ඇතුලත් කර ගැනීම සඳහා සෙනෙට් සභාව ස්ථාපනය කල යුතු බව අදහස විය.

**1972 අහෝසි කරන විට ඉදිරිපත් කළ තර්කය :-**

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුලට උගත් බුද්ධිමත් විවිධ ක්ෂේත්‍රවල දක්‍ෂයින් ඇතුලත් වී තිබුණි. එමගින් පැහැදිලි වන්නේ උගතුන් බුද්ධිමතුන් දේශපාලන කටයුතු වලට සම්බන්ධ වූ බවයි. නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුළ පැවති උසස් වාද විවාද මගින් එය සනාථ වේ. සෙනෙට් සභාව තුලින් ව්‍යවස්ථාදායකයට ඇතුලත් වූයේ මැතිවරණ වලින් ජනතාව ප්‍රතික්ෂේප කළ බංකොලොත් වූ දේශපාලකයින් ය. මෙම තත්ත්වය මත 1972 දී සෙනෙට් සභාව අහෝසි කිරීමට විධි විධාන යොදන ලදි.

## 3. සුළු ජන කොටස්වල ව්‍යවස්ථාදායකය තුළ නියෝජනයක් හා ආරක්‍ෂාවක් ලබා දීම.

**1947 දී පිහිටුවීමට බලපෑ හේතුව :-**

1947 දී සෙනෙට් සභාව ස්ථාපනය කිරීමට බලපෑ ප්‍රබල හේතු සාධකයක් ලෙස මෙය දැක්විය හැකිය. සෝල්බරි කොමිසම විසින් පුළු ජාතීන්ට විශේෂ වරප්‍රසාද ලබාදෙමින් සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ස්ථාපනය කළේය. එහි දී ව්‍යවස්ථාදායකයට සුළු ජාතික මන්ත්‍රීවරුන් ඇතුලත් කිරීම සම්බන්ධයෙන් විශේෂ උනන්දුවක් දක්නට ලැබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සඳහා සුළු ජාතීන් වෙනුවෙන් මන්ත්‍රීවරු 6 ක් පත්කිරීමේ බලය අග්‍රාණ්ඩුකාරවරයාට පවරා තිබුණි. සෙනෙට් සභාව ස්ථාපනය කරනු ලබන්නේ ද තවදුරටත් සුළු ජාතීන්ට ව්‍යවස්ථාදායකය තුළ නියෝජනයක් ලබාදීමේ අරමුණිනි.

**1972 අහෝසි කරන විට ඉදිරිපත් කළ තර්කය :-**

1972 දී සෙනෙට් සභාව අහෝසි කරන විට ඉදිරිපත් කළ අදහස වූයේ සෙනෙට් සභාව විසින් සුළු ජාතීන්ට නියෝජනයක් හෝ ආරක්‍ෂාවක් ලැබී නොමැති බවයි. සෙනෙට් සභාව අගමැතිගේ උපදෙස් මත නාමික විධායකය අග්‍රාණ්ඩුකාරවරයා විසින් සාමාජිකයන් 15 ක් පත් කළේ ය. එම පත් කිරීම් සුළු ජාතීන්ට නියෝජනයක් ලැබෙන සේ සිදු නොවුනි. එම නිසා සෙටේ සභාව තුලින් සුළු ජාතීන් නියෝජනය නොවුනි. ඇතැම් විට සුළු ජාතීන් වෙනුවෙන් පත් වුව ද එම මන්ත්‍රීවරු සේවය කලේ සුළු ජාතීන් වෙනුවෙන් නොව තමන් පත් කිරීමට තීරණය කළ අගමැතිවරයාටය. එසේ සිදු කළේ නැවත පත්වීම සඳහා අගමැතිවරයා සතුටු කිරීමට සිදු වීමයි.

නිදර්ශන -: මුස්ලිම්වරුන් වෙනුවෙන් පත් කළ බද් - උන් - දින් මොහොමඩ් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ කටයුතු කළ ආකාරය.

**එස්. නඩේෂන් එක්සත් ජාතික පක්ෂ සමග කටයුතු කළ ආකාරය.**

මෙම ආකාරයට සුළු ජාතීන්ට නියෝජනයක් හා ආරක්ෂාවක් ලබා දීම සෙනෙට් සභාව ස්ථාපනය කිරීමේ අරමුණක් වුවද එය ඉටු නොවීම නිසා 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් එය අහෝසි කරන ලදි.

## 4. බ්‍රිතාන්‍ය ව්‍යවස්ථා සම්ප්‍රදාය අනුගමනය කිරීම බලාපොරොත්තු වීම.

**1947 දී පිහිටුවීමට බලපෑ හේතුව :-**

සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය කරනු ලැබුවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පූර්වාදර්ශය කොට ගනිමිනි. බ්‍රිතාන්‍ය ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුව ද්විමාණ්ඩලික ව්‍යුහයකින් යුක්තය. එසේම බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිත බවට පත්ව තිබූ බොහෝ රාජ්‍යයන්හි ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුව ද්විමාණ්ඩලික ආකෘතියකින් යුක්ත විය. ඉන්දියාව - කැනඩාව - ඕස්ට්‍රේලියාව - දැක්විය හැකිය. 1947 දී සෝල්බරි ව්‍යවස්ථාදායකය ද්විමාණ්ඩලික ව්‍යුහයකින් ස්ථාපනය කිරීමේ අවශයතාවය මත සෙනෙට් සභාව නිර්මාණය කළ යුතු බව සෝල්බරි කොමිසමේ අදහස විය. එම නිසා සෙනෙට් සභාව පිහිටුවන ලදි.

**1972 දී අහෝසි කරන විට ඉදිරිපත් කළ තර්කය :-**

බ්‍රිතාන්‍ය ඇතුළු අනෙකුත් රාජ්‍යයන්හි ව්‍යවස්ථාදායකය ද්විමාණ්ඩලික ව්‍යුහයක් පැවතීමට අදාළ අතිශයින් සාධාරණ හේතු සාධක පවතී. නිදර්ශන ලෙස ඉන්දියාවේ - කැනඩාවේ - ඕස්ට්‍රේලියාවේ සංඝීය ආණ්ඩුක්‍රම නිර්මාණය වී තිබීම. සංඝීය ක්‍රමයක ව්‍යවස්ථාදායකය ද්විමාණ්ඩලික විය යුතු මය. ඒ මධ්‍ය ආණ්ඩුව තුළ ප්‍රාන්ත රාජ්‍යයන්ට නියෝජනයක් ලබා දීම සඳහාය.බ්‍රිතාන්‍ය ඒකීය ක්‍රමයක් වුවද දෙවැනි මණ්ඩලය සාම්ප්‍රදායික පාරම්පරික ආයතනයක් ලෙස උත්පාද වී තිබේ. මෙම තත්ත්වයන් මත එම රාජ්‍යයන්ට දෙවැනි මණ්ඩලයක් පැවතීමට අවශ්‍ය වාස්ථවික තත්ත්වයන් පවතී. නමුත් ශ්‍රී ලංකාව තුළ දෙවැනි මණ්ඩලයක අවශ්‍යතාවය සාදාරණීකරණය කිරීමට අවශ්‍ය කිසිදු වාස්ථවික හේතු සාධක නොමැත. එම නිසා 1972 දී සෙනෙට් සභාව අහෝසි කරන ලදි.

**තවදුරටත්,**

## 5. මහජන මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු වලට සහාය දැක්වීම.

**1947 දී පිහිටුවීමට බලපෑ හේතුව :-**

1947 දී ශ්‍රී ලාංකිකයන්ට අර්ධ නිදහසක් ප්‍රධානය කරන විට දේශපාලන වශයෙන් විශාල කාර්ය හා බලතල ප්‍රමාණයක් නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සතු විය. එම නිසා එම වැඩ කටයුතු වලට සහය දක්වන ආයතනයක් ලෙස සෙනෙට් සභාව පිහිටුවීම සෝල්බරි කොමිසමේ අරමුණ විය.

1972 දී අහෝසි කරන විට ඉදිරිපත් කළ තර්කය :-

1972 සෙනෙට් සභාව අහෝසි කළේ ය.සෙනෙට් සභාව ක්‍රියාත්මක වී තිබුණේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට සහාය දක්වන ආයතනයක් ලෙස නොව බාදාකාරී ආයතනයක් ලෙස වීම ඊට හේතුවයි.

## 6. ප්‍රජාතාන්ත්‍රික ව්‍යවස්ථා සම්ප්‍රදායට නොගැලපීම.

ව්‍යවස්ථාදායකයක් ප්‍රජාතන්ත්‍රවාදී වීම සඳහා එහි සාමාජිකයන් බවට පත්විය යුත්තේ මහජන නියෝජිතයන් ය. නමුත් සෙනෙට් සභාවේ සාමාජිකයන් නාමකරණයෙන් පත් කළ සාමාජිකයන් ය. අග්‍රාණ්ඩුකාරවරයා විසින් අගමැතිගේ උපදෙස් මත පත් කිරීම් සිදු කරයි. එසේම සෙනෙට් මණ්ඩලය නිලකාලයකට පසු විසිරී යන ආයතනයක් නොවේ. එය ස්ථිර මණ්ඩලයකි. සභාවෙන් 1/3 ක් වසර දෙකකට වරක් ඉවත් වෙයි. ඒ අනුවද එහි ප්‍රජාතාන්ත්‍රික භාවය අඩුය. මෙවැනි තත්ත්වයන් මත 1972 සෙනෙට් සභාව අහෝසි කරන ලදි.

## 7. ආණ්ඩු පෙරලියක් වූ අවස්ථාවලදී සෙනෙට් සභාව විරුද්ධ පක්ෂයේ පිරිසකගෙන් සමන්විත වීම.

හදිසියේ ආණ්ඩු පෙරලියක් වූ අවස්ථාවක සෙනෙට් මණ්ඩලය විරුද්ධ පක්ෂයේ පිරිසකගෙන් සමන්විත වෙයි. එවැනි තත්ත්වයක් මත ව්‍යවස්ථාදායකයේ කාර්යයන් අකාර්යක්ෂම වීම ඉහළ මට්ටමක පවතී. මේ තත්ත්වය 1956 සහ 1970 බලයට පැමිණි ආණ්ඩු භුක්ති විඳි තත්ත්වයන් අධ්‍යයනය කිරීම මගින් අවබෝධ කොට ගත හැකිය. එම නිසා 1972 දී සෙනෙට් සභාව අහෝසි කරන ලදි.

# වි ධායකය

- නාමික විධායකය
- කැබිනට් මණ්ඩලය
- අගමැති

# **නා** මික විධායකය (අග්‍රාණ්ඩුකාරවරයා)

<u>හැඳින්වීම</u>

කවුද :

1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පිහිටුවා ඇති <u>නාමික විධායකය අග්‍රාණ්ඩුකාරවරයායි</u>. අග්‍රාණ්ඩුකාරවරයා රාජ්‍යය නායිකාව වන **බ්‍රිතාන්‍යය රැජිණගේ නියෝජිතයා - විධායකයේ ප්‍රධානියා - සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයා** වන්නේ ය.

පත්කිරීම

<u>සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අග්‍රාණ්ඩුකාරවරයා පත් කරනු ලබන්නේ රාජ්‍ය නායිකාව රැජින විසිනි.</u> ලංකාවේ අගමැතිගේ උපදෙස් මත රැජින විසින් මෙම පත් කිරීම සිදු කරයි.

නිලකාලය

<u>අග්‍රාණ්ඩුකාරවරයාගේ නිල කාලය සම්බන්ධයෙන් නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා නැත.</u> අග්‍රාණ්ඩුකාරවරයාගේ නිල කාලය තීරණය වූයේ රැජිනගේ කැමැත්ත මතය. <u>අග්‍රාණ්ඩුකාර ධූරය දරමින් සිටින පුද්ගලයා නැවත එම ධූරයට පත් කරනවාද නැත්නම් වෙනත් අයෙකු පත් කරනවා ද යන්න වසර පහෙන් (5) පහට සොයාබලන සම්ප්‍රදායක් එකල පැවතුනි</u>.

ඉවත්කිරීම.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අග්‍රාණ්ඩුකාරවරයා වෙත පවරා ඇති කාර්යයන් කාර්යක්ෂම ලෙස හෝ පිළිගත් ආකාරයට ඉටුනොකරන්නේ නම් ඔහු එම ධූරයෙන් ඉවත් කොට ඒ වෙනුවෙන් වෙනත් අයෙකු පත් කිරීමට අගමැතිගේ උපදෙස් මත රාජ්‍ය නායිකාව රැජිනට හැකිය. සරලව දක්වන්නේ නම් <u>අග්‍රාණ්ඩුකාරවරයා කෙරෙහි රැජින තුළ පවතින විශ්වාසය පළුදු වූ විට රැජිණට අග්‍රාණ්ඩුකාරවරයා ඉවත් කළ හැකිය</u>. **අග්‍රාණ්ඩුකාර ධූරයේ පුරප්පාඩු ඇති වූ විට අග්‍රවිනිශ්චකාරවරයා නාමික විධායකයට අයත් කාර්ය හා බලතල ක්‍රියාවට නංවන ලදි.**

1947 ව්‍යවස්ථාවට අනුව ධූරදැරූ අග්‍රාණ්ඩුකාරවරු

1947 ප්‍රථම ජනරජ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාලව නාමික විධායක ධූර හෙබවූ අග්‍රාණ්ඩුකාරවරු කිහිප දෙනෙකුට නිදර්ශන. **සෝල්බරි සාමි වරයා - සර් ඔලිවර් ගුණතිලක.**

## ■ <u>අග්‍රාණ්ඩුකාරවරයාගේ කාර්ය හා බලතල.</u>

සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව නාමික විධායකය අග්‍රාණ්ඩුකාරවරයා වෙත **ව්‍යවස්ථාදායක , විධායක , අධිකරණ** යන ත්‍රිවිධ අංශ සතු බලතල හිමි කර දී තිබුණි. නමුත් මෙම ත්‍රිවිධ අංශ සතු බලතල ක්‍රියාවට නැංවිය යුත්තේ අගමැතිගේ උපදෙස් මතය.

• <u>ව්‍යවස්ථාදායක අංශයේ කාර්ය හා බලතල. (භූමිකාව)</u>

(i) **සෑම පනත් කෙටුම් පතකටම අවසාන අනුමැතිය දීම.**

පාර්ලිමේන්තුව සම්මත කරන ලද පනත් කෙටුම් පතක් නිතියක් බවට පත්වීමට නාමික විධායකය වන අග්‍රාණ්ඩුකාරවරයා අවසාන අනුමැතිය ලබා දිය යුතු ය.

(ii) **පාර්ලිමේන්තුව කැදවීම, කල්දැමීම හා විසුරුවා හැරීම.**

අග්‍රාණ්ඩුකාරවරයාට ව්‍යවස්ථාදායකය කැඳවීම. කල්තැබීම හා විසුරුවා හැරීම සම්බන්ධයෙන් බලතල තිබුණි.

(iii) **නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට මන්ත්‍රීවරුන් හයක් (6) පත් කිරීම.**

අග්‍රාණ්ඩුකාරවරයා විසින් සුළු ජාතීන්ට නියෝජනයක් ලැබෙන ලෙස මන්ත්‍රීවරු හයක් (6) ව්‍යවස්ථාදායකයේ පළමු සභාව වන නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට පත් කරනු ලබයි. එසේම එම මන්ත්‍රීන් හය දෙනා සම්බන්ධ පුරප්පාඩු පිරවීම ද සිදු කරනු ලබයි.

(iv) **සෙනෙට් සභාවට මන්ත්‍රීවරු පහළොවක් (15) ක් පත් කිරීම.**

සෙනෙට් සභිකයන් පහළොවක් (15) අගමැතිගේ උපදෙස් මත පත් කරයි. එම මන්ත්‍රීවරුන් සම්බන්ධ පුරප්පාඩු පිරවීම ද අග්‍රාණ්ඩුකාර වරයා විසින් සිදු කරනු ලබයි.

(v) **විශේෂ අවස්ථාවලදී පාර්ලිමේන්තුවේ මූලාසනය දැරීම.**

සාමාන්‍යය තත්ත්වයක් තුළ ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවේ මුලසුන කථානායක වරයා දරයි. නමුත් විශේෂ අවස්ථාවල දී ව්‍යවස්ථාදායකයේ මුලසුන නාමික විධායක අග්‍රාණ්ඩුකාරවරයා දරයි.

(vi) **නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ලේකම්වරයා පත් කිරීම.**

(vii) **සෙනෙට් සභාවේ ලේකම් වරයා පත් කිරීම.**

• <u>විධායක අංශයේ කාර්ය හා බලතල (භූමිකාව)</u>

(i) **අගමැති පත් කිරීම.**

<u>අගමැතිවරයා පත් කිරීම නාමික විධායක අග්‍රාණ්ඩුකාරවරයා සතු ප්‍රධානතම විධායක බලතලයකි.</u> අගමැතිගේ උපදෙසකින් තොරව සිදුකරන වැදගත් ක්‍රියාවත් ලෙසද මෙය හඳුනාගත හැකිය. නමුත් අග්‍රාණ්ඩුකාරවරයාට ස්වකීය අභිමතය පරිදි අගමැති පත් කිරීමට නොහැකිය. <u>අගමැති ලෙස තෝරාපත් කළ යුත්තේ පාර්ලිමේන්තුවේ පළමු සභාව වන නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ වැඩි දෙනාගේ විශ්වාසය දිනාගත් මන්ත්‍රීවරයාය.</u>

**අග්‍රාණ්ඩුකාරවරයා විසින් අගමැතිවරයකු තෝරාපත් කරන අවස්ථා කිහිපයකි.**

*මහමැතිවරණයකට පසුව.*
*විශ්වාසභංග යෝජනාවකින් අගමැතිවරයා ඉවත් කළ පසු.*
*අගමැතිවරයා මිය යෑම, ඉල්ලා අස්වීමකින් අනතුරුව.*

(ii) **අමාත්‍ය මණ්ඩලය පත් කිරීම.**

අගමැතිවරයා විසින් ව්‍යවස්ථාදායකයේ මණ්ඩල දෙක තුලින්ම තෝරාගනු ලබන මන්ත්‍රීවරුන් අමාත්‍යමන්ඩලයට පත් කරනු ලබන්නේ අග්‍රාණ්ඩුකාරවරයා විසිනි.

(iii) **රාජාසන කථාව කියවීම.**

කැබිනට් මණ්ඩලය එනම් ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන ඇතුලත් ලේඛනය, ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ව්‍යවස්ථාදායකය ඉදිරියේ කියවනු ලබන්නේ අග්‍රාණ්ඩුකාරවරයා විසිනි.

(iv) **රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීම.**

සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ රාජ්‍යය සේවා කොමිෂන් සභාවක් පිහිටුවා තිබුණි. එහි සභාපතිවරයා ඇතුළු අනිකුත් සාමාජිකයන් පත් කිරීම අග්‍රාණ්ඩුකාරවරයා විසින් සිදු කරයි.

(v) **උසස් රාජ්‍ය නිලධාරීන් පත් කිරීම.**

මෙම නිලධාරීන් ලෙස කැබිනට් මණ්ඩලයේ ලේකම් වරයා- විවිධ අමාත්‍යාංශවල ප්‍රධානීන් ලෙස කටයුතු කරන ස්ථිර ලේකම්වරු විගණකාධිපති - මැතිවරණ කොමසාරිස් - නීතිපති අයත්වේ.

(vi) **පාර්ලිමේන්තු ලේකම්වරු පත් කිරීම.**

- අධිකරණ අංශයේ කාර්යය හා බලතල (භූමිකාව)

(i) **උසස් අධිකරණ ආයතන වලට විනිශ්චකාරවරු පත් කිරීම.**

අග්‍රවිනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චකාරවරු, අපරාධ විනිශ්ච කොමසාරිස්වරුන් පත් කිරීම සහ ඉවත් කිරීම .

(ii) **ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන්ගේ ධූරකාල දීර්ඝ කිරීම.**

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවකු විශ්‍රාම යන වයස අවුරුදු 62 කි. නමුත් අගමැතිගේ උපදෙස් මත එය වසරකින් දීර්ඝ කිරීමට අග්‍රාණ්ඩුකාරයාට හැකිය.

(iii) **අධිකරණ සේවා කොමිසන් සභාවට සාමාජිකයන් පත් කිරීම.**

පහළ අධිකරණ ආයතන වල කටයුතු සඳහා මෙම කොමිෂන් සභාව පිහිටුවා තිබුණි. මෙහි සාමාජිකයන් සංඛ්‍යාව 3 කි. ඔවුන් පත් කිරීම අග්‍රාණ්ඩුකාරවරයා විසින් සිදු කරයි.

(iv) **වරදකරුවන්ට සමාව දීම.**

- සමාජමය ස්වරූපයක් ගත් කාර්යයන්ට සම්බන්ධ වීම.

(i) ජාතික, සමාජයීය. ආගමික වශයෙන් වැදගත් උත්සව වලට සම්බන්ධ වීම.

(ii) සැණකෙළි විවෘත්ත කිරීම.

මේ ආකාරයට නාමික විධායකය වන අග්‍රාණ්ඩුකාරවරයා **ව්‍යවස්ථාදායක,විධායක, අධිකරණ** යන ත්‍රිවිධ අංශ වල බලතල හා කාර්යයන් හිමි වී තිබුණි. එහෙත් නාමික විධායකය වන අග්‍රාණ්ඩුකාර වරයා මෙම බලතල ක්‍රියාවට නැංවිය යුත්තේ දේශපාලන විධායකයේ නායකයා වන අගමැතිගේ උපදෙස් මතයි.

- අග්‍රාණ්ඩුකාරවරයාගේ තත්ත්වය (උපයෝගීතාවය)

අග්‍රාණ්ඩුකාරවරයා ඇතැම්විට සම්ප්‍රදායන් නොසලකා හරිමින් බලවත්ව හා අත්තනෝමතිකව ක්‍රියාත්මක වූ අවස්ථා සෝල්බරි අවධිය තුළ සටහන්වේ.

නිදර්ශන -

1952 වසරේ අගමැති ඩී.එස්. සේනානායක මහතාගේ අභාවය හේතුකොටගෙන නව අගමැතිවරයෙකු පත් කිරීම අවශ්‍ය කරුණක් බවට පත්ව තිබුණි. මේ වන විට නියෝජිත මන්ත්‍රීමණ්ඩලයේ වැඩිදෙනාගේ විශ්වාසය දිනාගෙන සිටියේ සර් ජෝන් කොතලාවලය. නමුත් සෝල්බරි සාමිවරයා ඔහු නොසලකා හරිමින් ඩී.එස් සේනානායකගේ පුත් ඩඩ්ලි සේනානායක අගමැති ධූරයටපත් කිරීම.

1960 මැතිවරණයේදී වැඩි ආසන සංඛ්‍යාවක් දිනාගනු ලැබුවේ එක්සත් ජාතික පක්ෂයයි. පාර්ලිමේන්තුවේ ආසන 151 න් ආසන 50 ක් එක්සත් ජාතිකපක්ෂයට හිමිවූ අතර ආසන 46 ක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ද ඉතිරි ආසන 55 එම මැතිවරණයට තරග කළ සෙසු පක්ෂ අතර ද බෙදී ගියේ ය. මෙම තත්ත්වය තුළ අග්‍රාණ්ඩුකාරවරයා කළයුතුව තිබුණේ ප්‍රධාන පක්ෂ දෙක සමඟ සාකච්ඡා කොට ආණ්ඩුව පිහිටුවීමට පදනම සහිත පක්ෂයකින් අගමැතිවරයා පත්කිරීමය. නමුත් ඒ මොහොතේ අග්‍රාණ්ඩුකාර සර් ඔලිවර් ගුණතිලක අගමැති ධූරය සඳහා පත්කරනු ලබන්නේ ඩඩ්ලි සේනානායකය. ඔහුට ආණ්ඩුව පවත්වාගෙන යාමට අවශ්‍ය බහුතරය පාර්ලිමේන්තුව තුළ නොමැති වූ බව ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පාර්ලිමේන්තුව තුළ පරාජයට පත්වීමෙන් පැහැදිලි වේ. මෙම තත්ත්වය තුළ ආණ්ඩුකාරවරයාගේ ක්‍රියාකලාපය දේශපාලන වශයෙන් මතභේදයකට තුඩුදුන්නේ ය.

1960 මැතිවරණය තුළ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය සෙනෙට් මණ්ඩලයට තෝරාපත් කරමින් අගමැතිවරිය ලෙස පත්කිරීමට ඔලිවර් අග්‍රාණ්ඩුකාරවරයා ක්‍රියා කිරීම.

1958 - 1959 හදිසි අවස්ථා මොහොතේ කැබිනට් අමාත්‍යවරු එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක අගමැතිවරයා සම්බන්ධයෙන් විශ්වාසය තැබීමට වඩා අග්‍රාණ්ඩුකාරවරයා කෙරෙහි විශ්වාසය තබමින් කටයුතු කිරීම.

# අගමැතිවරයා

හැඳින්වීම

කවුද : සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අගමැතිවරයා, **ආණ්ඩුවේ නායකයා - දේශපාලන විධායකය වන කැබිනට් මණ්ඩලයේ නායකයා වේ.**

පත්කිරීම

ආණ්ඩුවේ නායකයා වන අගමැතිවරයා පත් කරනු ලබන්නේ රාජ්‍ය නායකයා වන රැජිනගේ නියෝජිතයා විසිනි. අග්‍රාණ්ඩුකාරවරයා විසින් ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුළ වැඩිම ආසන ගණනක් දිනාගත් දේශපාලන පක්ෂයේ නායකයා අගමැතිවරයා ලෙස තෝරාපත් කරයි. **අගමැතිවරයෙකු පත් කරන ප්‍රධාන අවස්ථා තුනකි.**

- **මහමැතිවරණයකට පසුව**
- **විශ්වාස භංග යෝජනාවකින් අගමැතිවරයා ඉවත් කළ විට**
- **අගමැතිවරයා ඉල්ලා අස්වීම හෝ මිය යාම.**

අගමැතිවරයා පත් කිරීමේ දී අග්‍රාණ්ඩුකාරවරයා විසින් සම්ප්‍රදාය බිඳ දැමූ අවස්ථාද පවතී. වෙනත් ආකාරයකට දක්වන්නේ නම් අත්තනෝමතිකව අගමැතිවරයා පත්කළ අවස්ථා කිහිපයකි.

නිදර්ශන -: **1952 අගමැති ඩී.එස්. සේනානායක** මහතාගේ අභාවයෙන් පසුව, අගමැති තනතුරට පත්වීම සඳහා සුදුසුකම් සපුරා තිබූ **සර් ජෝන් කොතලාවල** නොසලකා හරිමින් ඩී.එස්. සේනානායකගේ පුත් **ඩඩ්ලි සේනානායක** මහතා අගමැති ධූරයට පත් කිරීම.

**1960 සිරිමාවෝ බණ්ඩාරනායක** සෙනට් මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකාවක් ලෙස ක්‍රියාකරමින් අගමැති ධූරයට තෝරාපත් කිරීම ඔලිවර් ගුණතිලක අග්‍රාණ්ඩුකාරවරයා සිදු කිරීම.

නිලකාලය

1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අගමැතිවරයාගේ නිලකාලය **වසර පහ (5) කි.**

ඉවත්කිරීම.

ව්‍යවස්ථාදායකය නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුළ සම්මත කරනු ලබන **විශ්වාස භංග යෝජනාවක්** මගින් අගමැතිවරයා ඉවත් කළ හැකිය. මීට අමතරව **අගමැතිධූරයේ පුරප්පාඩු ඇතිවිය හැකි අවස්ථා,**

- ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය (රාජාසන කථාව) පාර්ලිමේන්තුවේ පළමු අවස්ථාවේදී හැර වෙනත් අවස්ථාවක ප්‍රතික්ෂේපවීම.
- ආණ්ඩුවේ විසර්ජන කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් සම්මත නොකිරීම.

1947 ව්‍යවස්ථාවට අනුව ධූරදැරූ අගමැතිවරු

සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ අගමැතිධූර හෙබවූ අගමැතිවරුන් කිහිප දෙනෙකුට නිදර්ශන. **ඩී. එස්. සේනානායක (ජාතියේ පියා) - ඩඩ්ලි සේනානායක - සර් ජෝන් කොතලාවල - එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක (පොදු ජනයාගේ මිනිසා) - සිරිමාවෝ බණ්ඩාරණායක.**

■ <u>අගමැතිවරයාගේ කාර්ය හා බලතල.</u>

අගමැතිවරයාට ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන අංශ සම්බන්ධ විශාල බලතල ප්‍රමාණයක් හිමි වේ. <u>අග්‍රාණ්ඩුකාරවරයා නාමික විධායකය පමණක් නිසා අග්‍රාණ්ඩුකාර වරයාගේ නාමයෙන් සිදුවන බොහෝ කාර්යයන් අගමැතිවරයාගේ තීරණ වේ. සෝල්බරි ආණ්ඩුක්‍රමයේ බලවත්ම ධූරය අගමැති ධූරය වේ</u>.

● <u>ව්‍යවස්ථාදායක අංශයේ කාර්ය හා බලතල (භූමිකාව).</u>

(i) **ව්‍යවස්ථාදායකය පාර්ලිමේන්තුව කැඳවීම - කල්දැමීම - විසුරුවා හැරීම තීරණය කිරීම.**

ව්‍යවස්ථාදායකය පාර්ලිමේන්තුව කැඳවීම - කල්දැමීම - විසුරුවා හැරීම තීරණය කරනු ලබන්නේ අගමැතිවරයා විසින්. එය ක්‍රියාත්මක කරනු ලබන්නේ අග්‍රාණ්ඩුකාරවරයා ය.

(ii) **නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට මන්ත්‍රීවරු හයක් (06) පත් කිරීම.**

(iii) **සෙනෙට් සභාවට මන්ත්‍රීවරු පහළොවක් (15) පත් කිරීම තීරණය කිරීම.**

(iv) **ව්‍යවස්ථාදායකය තුළින් තමාට අවශ්‍ය නීති සකස් කරවා ගැනීම.**

අගමැතිවරයා යනු ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ වැඩිම දෙනාගේ විශ්වාසය දිනාගත් මන්ත්‍රී වරයාය. එම නිසා අගමැතිවරයාට නියෝජිත මන්ත්‍රී මණ්ඩලය මගින් තමාට අවශ්‍ය නීති සකස් කරවා ගත හැකිය.

(v) **ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුව අවශ්‍ය පරිදි පාලනයට සහ මෙහෙය වීමට හැකි වීම.**

● <u>විධායක අංශයේ කාර්ය හා බලතල (භූමිකාව)</u>

(i) **කැබිනට් මණ්ඩලයේ නායකයා වීම.**

(ii) **කැබිනට් මණ්ඩලයට සාමාජිකයන් පත් කිරීම - මාරු කිරීම - ඉවත් කිරීම තීරණය කිරීම.**
කැබිනට් මණ්ඩලයට තෝරාගනු ලබන සාමාජිකයින් තීරණය කරනු ලබන්නේ අගමැතිවරයාය. ඔවුන්ගේ කාර්ය ක්ෂේත්‍රය (විෂය) නම් කිරීම - අමාත්‍යාංශ ලබා දීම හා අමාත්‍යාංශ මාරු කිරීම අගමැතිවරයාගේ අභිමතය මත සිදු වේ. කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන් ඉවත් කිරීම - කැබිනට් මණ්ඩලය සංශෝධනය කිරීම තීරණය කරනු ලබන්නේ අගමැතිවරයා විසිනි.

(iii) **ආරක්ෂාව සම්බන්ධ බලතල**

(iv) **විදේශ කටයුතු සම්බන්ධ බලතල**

(v) **කැබිනට් මණ්ඩලය තමාට අවශ්‍ය ආකාරයට පාලනය කිරීම.**

අගමැතිවරයා කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියාය. එම නිසා එහි අමාත්‍යවරුන් නායකයා වන අගමැතිට අවනත විය යුතු ය. එසේ අවනත නොවන අමාත්‍යවරුන් ඉවත් කරන බවට තර්ජනය කරමින් බලහත්කාරයෙන් අවනතකරවා ගත හැකිය. එම නිසා කැබිනට් මණ්ඩලය තමාට අවශ්‍ය ආකාරයට පාලනයට හා මෙහයෙ වීමට අගමැතිවරයාට හැකිය.

● <u>අධිකරණ අංශයේ කාර්ය හා බලතල (භූමිකාව)</u>

(i) **උසස් උධිකරණ ආයතනවලට විනිශ්චකාරවරු පත් කිරීම තීරණය කිරීම.**

(ii) **අධිකරණසේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් පත් කිරම තීරණය කිරීම.**

(iii) **වරදකරුවන්ට සමාවදීම - දඬුවම් ලිහිල්කිරීම - දඬුවම් සංශෝධනය කිරීම තීරණය කිරීම.**

මෙම ආකාරය
ට සෝල්බරි යටතේ අගමැතිවරයා ව්‍යවස්ථාධායක - විධායක - අධිකරණ යන ත්‍රිවිධ ආයතන සතු විශාල බලතල ප්‍රමාණයක් හිමිව තිබේ.

● <u>**අගමැතිවරයාගේ තත්ත්වය (උපයෝගීතාවය)**</u>

සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව නිර්මාණය කර ඇති බලවත්ම ධූරය වන්නේ අගමැතිධූරයයි. සෝල්බරි ආණ්ඩුක්‍රමය තුළ අගමැති ධූරයට පත් වූයේ **සිංහල - බෞද්ධ - ගොවිගම** කුලයේ අයෙකි. එක්සත් ජාතික පක්ෂයේ පමණක් නොව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ද තම නායකයන් තෝරන විට වර්ගය - ආගම - කුලය යන සාධක කෙරෙහි විශේෂ අවධානයක් දැක්වීය. මෙම තත්ත්වය තුළ සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ අගමැතිවරුන් බවට පත්වූයේ **සේනානායකවරු හා බණ්ඩාරනායක වරුන්ය** (එක් අවස්ථාව හැර) මේ යටතේ පත් වූ ඇමතිවරු අනුභාසාත්මක නායකත්වයක් ගොඩනගාගත්තේ ය. මෙවැනි තත්ත්වයක් තුළ **වැඩ වර්ජන - වාර්ගික ගැටුම් - හමුදා කුමන්ත්‍රණ - සන්නද්ධ නැගිටීම්** යන අර්බුදකාරී දේශපාලන පරිසරයන් තුළ අගමැතිවරුන්ට නොසැලී ක්‍රියාත්මක වීමට අදාළ තත්ත්වයන් නිර්මාණය වී තිබුණි.

# කැබිනට් මණ්ඩලය.

<u>හැඳින්වීම</u>

මොකක්ද : සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පිහිටුවා ඇති <u>දේශපාලන විධායකය - ක්‍රියාකාරී විධායකය - සත්‍යය විධායකය කැබිනට් මණ්ඩලයයි</u>.

සංයුතිය (සාමාජිකයන්/ පත්කිරීම)

කැබිනට් මණ්ඩලයේ <u>සංයුතිය</u> වන්නේ අගමැතිවරයා සහ විවිධ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු නියෝජනය කරනු ලබන ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ගෙන් සමන්විත සභාවකි. එහි සමාජිකයන් 10 සීමාවිය යුතු යැයි සෝල්බරි කොමිසමේ නිර්දේශය විය.

කැබිනට් මණ්ඩලය පත් කිරීමේ මූලික කාර්ය වන්නේ අගමැතිවරයා තෝරාපත් කිරීමයි. ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවේ පළමු සභාව වන නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ බහුතර ආසන ගණනත් දිනාගත් දේශපාලන පක්ෂයේ නායකයා අගමැතිවරයා ලෙස අග්‍රාණ්ඩුකාරවරයා විසින් තෝරාපත් කරයි. දෙවනුව අගමැතිවරයාගේ උපදෙස් මත ව්‍යවස්ථාදායකය තුළින් කැබිනට් අමාත්‍යවරුන් තෝරා පත් කිරීම අග්‍රාණ්ඩුකාරවරයා විසින් සිදු කරයි.

(**N.B**) **සාමාජිකයන් දස දෙනෙකුගෙන් (10) යුක්ත කැබිනට් මණ්ඩලයක් යෝග්‍යයැයි සෝල්බරි කොමිසම නිර්දේශ කොට තිබුණි. නමුත් ස්ථාවර ආණ්ඩුවක් පවත්වා ගැනීම සඳහා කැබිනට් මණ්ඩලයේ සාමාජිකත්වයේ ප්‍රමාණය තීරණය කිරීමේ හැකියාව අගමැතිවරයාට තිබුණි.**

**සෝල්බරි පාලන අවධිය තුළ කැබිනට් මණ්ඩල සාමාජික ප්‍රමාණයයන්**

| කාල පරාසය | පාලන අවධිය | ඇමතිවරුන් සංඛ්‍යාව |
|---|---|---|
| 1947 - 1952 | එ.ජා.ප (ඩී.එස්. සේනානායක ආණ්ඩුව) | 14 |
| 1952 - 1953 | එ.ජා.ප (ඩඩ්ලි සේනානායක ආණ්ඩුව) | 14 |
| 1953 - 1956 | එ.ජා.ප (ජෝන් කොතලාවල ආණ්ඩුව) | 14 |
| 1956 - 1959 | ම.එ.පෙ (බණ්ඩාරනායක ආණ්ඩුව) | 15 |
| 1959 - 1960 | දහනායක ආණ්ඩුව | 28 |
| 1960 මාර්තු-ජුලි | එ.ජා.ප (ඩඩ්ලිසේනානායක ආණ්ඩුව) | 08 |
| 1960 - 1965 | ශ්‍රී.ල.නි.ප. (සිරිමාවෝ බණ්ඩාරනායක ආණ්ඩුව) | 15 |
| 1965 - 1970 | එ.ජා.ප (ඩඩ්ලිසේනානායක ආණ්ඩුව) | 17 |

කොන්දේසි

- මුදල් අමාත්‍යවරයා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුළින් පත් කළ යුතු වීම.
- අධිකරණ අමාත්‍යවරයා සෙනෙට් සභාව තුළින් පත් කළ යුතු වීම.
- අවම වශයෙන් අමාත්‍යවරු දෙදෙනෙක් සෙනෙට් සභාවෙන් පත් කළ යුතු වීම.
- ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශ අගමැතිවරයා සතු වියයුතු වීම.

නිලකාලයː සෝල්බරි කැබිනට් මණ්ඩලය නිල කාලය වසර පහකි. (5)

ඉවත් කිරීමː <u>නිල කාලය වසර පහ (5) අවසන් වීමට පෙර කැබිනට් මණ්ඩලය ඉවත් කළ හැකිය.</u> කැබිනට් මණ්ඩලය පාලන කටයුතු සම්බන්ධයෙන් ව්‍යවස්ථාධායක <u>පාර්ලිමේන්තුවට සාමූහිකව වගකිව යුතු ය</u>. වග නොකියනා අවස්ථාවල දී ව්‍යවස්ථාදායක නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුළ සම්මත කළ විස්වාස භාංග යෝජනාවක් මගින් කැබිනට් මණ්ඩලය ඉවත් කළ හැකිය.

තවදුරටත්,

- **අගමැතිවරයා ඉල්ලා අස්වූ විට හෝ මියගිය විට කැබිනට් මණ්ඩලය විසිර ගිය සේ සැලකීම.**
- **ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පළමු අවස්ථාවේදී හැර වෙනත් අවස්ථාවක ව්‍යවස්ථාදායකය ප්‍රතික්ෂේප වූ විට**
- **ආණ්ඩුවේ විසර්ජන කෙටුම්පත පාර්ලිමේන්තුව අනුමත නොකළ විට**

## ▪ <u>කැබිනට් මණ්ඩලයේ කාර්ය හා බලතල (භූමිකාව)</u>

1. **ආණ්ඩුවේ ප්‍රතිපත්ති තීරණය කිරීම.**

කැබිනට් මණ්ඩලය ප්‍රතිපත්ති සාකච්ඡා කරන සහ ඒවා තීරණය කරන සභාවයි. දේශීය හා විදේශීය වශයෙන් වැදගත් සෑම ප්‍රතිපත්තියක්ම මෙහි දී සාකච්ඡාවට ලක් කරයි. ආණ්ඩුවේ ප්‍රතිපත්ති තීරණය කිරිමට අදාළව සිදු කරන වැදගත් කාර්යන් තුනකි.

- ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය සකස් කිරීම.
- අයවැය ලේඛනය සකස් කිරීම.
- ව්‍යවස්ථාදායකය සකස් කරන නීති පවා මූලිකව තීරණය කිරීම.

2. **නීති ක්‍රියාත්මක කිරීම.**

කැබිනට් මණ්ඩලය නීති ක්‍රියාත්මක කරයි. ව්‍යවස්ථාදායකය විසින් සම්පාදිත නීති ක්‍රියාත්මක කරන්නේ කැබිනට් මණ්ඩලය විසින්. වෙනත් ලෙසකට දක්වන්නේ නම් කැබිනට් මණ්ඩලය මූලිකව තීරණය කර ව්‍යවස්ථාදායකය ලවා සම්පාදනය කරවා ගත් නීති කැබිනට් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරයි.

3. **පරිපාලන කටයුතු විධිමත් කිරීම.**

රාජ්‍යයේ කටයුතු විවිධ දෙපාර්තමේන්තු - අමාත්‍යාංශ වලට බෙදා දක්වමින් එම දෙපාර්තමේන්තු අතර සම්බන්ධතාවය පවත්වා ගැනීම, එම දෙපාර්තමේන්තු අතර ඇතිවන ගැටුම් කළමණාකරණය කරමින් පරිපාලන කටයුතු විධිමත් කිරීම කැබිනට් මණ්ඩලයේ කාර්යයකි.

තවදුරටත්,

4. **මුදල් තීරණය කිරීම.**

කුමන ආකාරයේ බදු පැනවිය යුතු ද එම බදු කෙසේ අයකර ගත යුතු ද එම මුදල් කෙසේ වැය කළ යුතු ද යන්න කැබිනට් මණ්ඩලය තීරණය කරයි. බදු පැනවීම - බදු අහෝසි කිරීම - බදු සංශෝධනය ආදිය තීරණය කරනු ලබන්නේ කැබිනට් මණ්ඩලය විසිනි.

● සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය.

(**N.B** කැබිනට් ක්‍රමය ආරම්භය හා වර්ධනය අධ්‍යයනය කරන්න.)

මෙය කැබිනට් මණ්ඩලයේ සහයෝගීතවයේ සහ සාමූහිකත්වයේ ප්‍රතිඵලයකි. කැබිනට් අමාත්‍යවරු පාලන කටයුතු සම්බන්ධයෙන් තනි තනිව නොව සාමූහිකව එනම් කැබිනට් මණ්ඩලයක් වශයෙන් ව්‍යවස්ථාදායකයට වගකිව යුතු බව මින් අර්ථවත් වේ. මෙම සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය කැබිනට් මණ්ඩලය තුළ හොඳින් ආරක්ෂා වූයේ නැත.

නිදර්ශන

- වෙළෙඳ ඇමති ආර්.ජී. සේනානායක, බ්‍රිතාන්‍යය සමග අත්සන් කළ **"රබර් - සහල් ගිවිසුම"** මුදල් ඇමති ජේ.ආර්. ජයවර්ධන විවේචනය කිරීම.
- පිලිප් ගුණවර්ධන යෝජනා කළ **"අඳගොවි පනත"** සෞඛ්‍ය ඇමතිනී විමලා විජේවර්ධන විවේචනය කිරීම.

□ සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය බිඳවැටීම බලපෑ හේතු කිහිපයක් පෙන්වා දිය හැකිය.

- **ද්වි පක්ෂ ක්‍රමය ශක්තිමත්ව ගොඩනැගී නොතිබීම.**
- **සභාග ආණ්ඩු නිර්මාණය වීම.**
- **කැබිනට් මණ්ඩලය තුළ බහුවාර්ගික හැඩයක් පැවතීම. (සිංහල - ද්‍රවිඩ - මුස්ලිම් - හින්දු)**
- **කැබිනට් ක්‍රමය ලාංකිකයන්ට ආධුනික ආණ්ඩුක්‍රමයක් වීම.**
- **ඩොනමෝර් අවදිය තුළ විධායක කාරක සභා ක්‍රමය තුළ මන්ත්‍රීවරුන් අධිකේවලත්වය සම්බන්ධයෙන් ලැබූ අත්දැකීම්**

# ස්ථිර විධායකය

# ස්ථිර විධායකය.
## රාජ්‍ය සේවය

● <u>රාජ්‍යය සේවය හැඳින්වීම</u>.

රජයේ සේවකයින් යනු, <u>මැති අමැතිවරුන් හැර රජයේ සේවය සම්බන්ධයෙන් වැටුප් ලබන පුද්ගලයන් ය.</u>

**නිදර්ශන -:** සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව, අග්‍රාණ්ඩුකාරවරයා - අග්‍රාණ්ඩුකාරවරයාගේ කාර්ය මණ්ඩලය - ඇමතිවරු - පාර්ලිමේන්තු ලේකම්වරු - කථානායක - පාර්ලිමේන්තුවේ නිලධාරීන් - රාජ්‍ය සේවා කොමිසන් සභාවේ සාමාජිකයින් - අධිකරණ නිලධාරීන් - අධිකරණ සේවා කොමිසන් සභාවේ සාමාජිකයන් හැර රජයේ සේවය වෙනුවෙන් වැටුප් ලබන අය රජයේ සේවකයන් වේ.

**රාජ්‍ය සේවය ස්ථිර විධායකය වේ**, ආණ්ඩුවේ තීරණ - ප්‍රතිපත්ති ජනතාව අතර ක්‍රියාවට නගනු ලබන්නේ රාජ්‍ය සේවකයින් ය. එම නිසා එය විධායකයක් වේ. ආණ්ඩු නිතර වෙනස් වුව ද රාජ්‍ය සේවය ස්ථාවරව පවතී. එම නිසා එය ස්ථිර සංස්ථාවකි. එම නිසා රාජ්‍යය සේවය ස්ථාවර විධායකය ලෙස හඳුන්වයි.

● <u>**රාජ්‍යය සේවයේ ස්ථර දෙකක් පවතී.**</u>

රජයේ සේවය

1 උසස් රාජ්‍ය නිලධාරීන්

2 අනෙකුත් රාජ්‍ය නිලධාරීන්

### 01. උසස් රාජ්‍ය නිලධාරීන්

<u>උසස් රාජ්‍ය නිලධාරීන් හැඳින්වීම</u>.

රජයේ උසස් නිලධාරීන් ලෙස හඳුනාගනු ලබන්නේ, **අග්‍රවිනිශ්වයකාරවරයා - ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්වකරුවන් - සැසි කොමසාරිස්වරු - භාණ්ඩාගාරයේ ලේකම් - නියෝජ්‍යය ලේකම් - කැබිනට් ලේකම් - මැතිවරණ කොමසාරිස් - නීති පති - අල්ලස් කොමසාරිස් - පළමු හා දෙවන ශ්‍රේණිවල තානාපතිවරුන්** ය.

<u>උසස් රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම් හා කාර්යයන්.</u>

උසස් රාජ්‍යය නිලධාරීන්ගේ වගකීම් හා කාර්යයන් එනම්, **පත් කිරීම් - මාරු කිරීම් - ඉවත් කිරීම - විනය පාලනය** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ම අග්‍රාණ්ඩුකාරවරයාට පවරා තිබුණි. අගමැතිවරයා සහ අමාත්‍යමණ්ඩලයේ උපදෙස් හා තීරණ මත අග්‍රාණ්ඩුකාරවරයා මෙම වගකීම් හා කාර්යයන් ඉටුකළ යුතු ය.

## 02. අනෙකුත් රාජ්‍ය නිලධාරීන්

<u>අනෙකුත් රාජ්‍ය නිලධාරීන් හැඳින්වීම</u>.

ඉහතින් දැක්වෙන ලද රජයේ උස් නිලධාරීන් හැර සෙසු රජයේ සේවකයින් අනිකුත් රාජයේ සේවකයන් ලෙස සරලව හැඳින්විය හැකිය.

<u>අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම් හා කර්යයන්</u>.

අනිකුත් රජයේ නිලධාරීන්ගේ වගකීම් හා කාර්යයන් එනම්, **පත් කිරීම - මාරු කිරිම - ඉවත් කිරීම - විනය පාලනය** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් **රාජ්‍යය සේවා කොමිසන් සභාවට** පවරා තිබුණි. <u>මෙම කොමිසන් සභාව ස්වාධීන කොමිසන් සභාවකි. එම නිසා සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ ස්වාධින රාජ්‍ය සේවයක් ස්ථාපනය කර තිබුණි</u>.

### රාජ්‍යය සේවා කොමිසන් සභාව.

<u>රාජ්‍ය සේවා කොමිසන් සභාව හැඳින්වීම</u>.

රජයේ උසස් නිලධාරීන් හැර අනෙකුත් රජයේ නිලධාරීන්ගේ වගකීම් හා කාර්යයන් එනම්, **පත් කිරීම - මාරු කිරීම - ඉවත් කිරීම - විනය පාලනය** සිදු කිරීමට පිහිටුවා ඇති ස්වාධීන කොමිසන් සභාව වේ. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 - 62 වගන්තිවල රාජ්‍ය සේවා කොමිසන් සභාව සම්බන්ධ විධි විදාන දැක්වේ.

<u>රාජ්‍යය සේවා කොමිසන් සභාවේ සංයුතිය</u>.

මෙම කොමිසන් සභාවේ සාමාජිකයන් ප්‍රමාණය 03 කි. මොවුන් පත් කරනු ලබන්නේ අග්‍රාණ්ඩුකාරවරයා විසිනි. මොවුන් තිදෙනාගෙන් එක් අයකු **කොමිසමේ සභාපතිවරයා** ලෙස අග්‍රාණ්ඩුකාරවරයා පත් කරයි. පසුව කොමිසන් සභාවේ සාමාජිකයන් විසින් **ලේකම්වරයෙක්** තෝරාපත් කර ගනී. **මෙම සාමාජිකයන් තිදෙනා අතුරින් එක් සාමාජිකයෙක් පමණ වත් මෙම පත් කිරීමට පෙර ගතවූ වසර පහක් තුළ අධිකරණ සේවයේ හෝ රාජ්‍ය සේවයේ තනතුරක් නොදැරූ අයෙකු විය යුතු ය.**

<u>රාජ්‍ය සේවා කොමිසන් සභාවේ නිලකාලය</u>.

රාජ්‍ය සේවා කොමිසන් සභාවේ සාමාජිකයකුගේ නිලකාලය වසර 05 කි. යළිත් වරක් තේරීපත් වීමට ද හැකිය. කොමිසමේ සාමාජිකයකු නිවාඩු ලබාගන්නේ නම් ඒ සඳහා වෙනත් අයෙකු පත් කිරීමට අග්‍රාණ්ඩුකරුට බලය ඇත. <u>මෙහි සාමාජිකයකු නිල කාලයට පූර්වයේ ඉවත් කිරීමේ බලය ද අග්‍රාණ්ඩුකාරවරයා සතුවේ. නමුත් ඒ සඳහා සාධාරණ හේතු දැක්විය යුතු ය</u>.

<u>රාජ්‍ය සේවා කොමිසන් සභාවේ වේතන (වැටුප්).</u>

රාජ්‍ය සේවා කොමිසන් සභාවේ සාමාජිකයන්ගේ වැටුප් (වේතන) පාර්ලිමේන්තුව විසින් තීරණය කළ යුතු ය. ඒකාබද්ධ අරමුදල මගින් ගෙවිය යුතු ය. සේවාකාලය තුල දී වැටුප් අඩු නොකළ යුතුයැයි කොන්දේසි පණවා තිබුණි.

රාජ්‍ය සේවා කොමිසන් සභාවේ කාර්ය හා බලතල.

(i) අනෙකුත් රාජ්‍ය සේවකයින් පත් කිරීම - මාරු කිරීම - ඉවත් කිරීම විනය පාලනය පාලනය කිරීම.

(ii) අනෙකුත් රාජ්‍යය සේවකයින් පත් කිරීම - මාරු කිරීම - ඉවත් කිරීම - විනය පාලනය සම්බන්ධ බලය රජයේ ගැසට් පත්‍රයේ පල කරන නියෝගයක් මගින් , එම නියෝගයේ සඳහන් කොන්දේසිවලට යටත්ව ඕනෑම රාජ්‍ය නිලධාරියකු වෙත පැවරීමේ බලය තිබුණි. මෙලෙස කොමිසම විසින් යම් රාජ්‍යය නිලධාරියකු වෙත පවරන ලද බලතල ක්‍රියාවට නැංවීමේ දී ඒ සම්බන්ධයෙන් කිසියම් පුද්ගලයකු සෑහීමකට පත් නොවේ නම් එවැන්නෙකුට ඒ සම්බන්ධයෙන් කොමිසම වෙත අභියාචනා කිරීමේ හැකියාව තිබුණි. එවැනි අභියාචනා සම්බන්ධයෙන් කොමිසමේ තීරණය අවසාන තීරණය විය.

- රාජ්‍ය සේවා කොමිසන් සභාවේ ස්වාධීනත්වය සඳහා ගෙන තිබූ ක්‍රියාමාර්ග.

(i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කොමිසමේ සාමාජිකත්වය ලබා නොදීම.

(ii) අමාත්‍ය මණ්ඩලයට කොමිසම බලපෑම් කළ නොහැකි වීම.

(iii) කොමිසමේ සාමාජිකයකු ඉවත් කිරීමට හේතු දැක්වීමකින් පසුව පමණක් අග්‍රාණ්ඩුකාරවරයාට හැකි වීම.

(iv) කොමිසමට බලපෑම් කිරීම රු. 1000 ක දඩ මුදලක් හෝ එක් වසරක සිර දඬුවමක් හෝ මෙම දඬුවම් දෙකම ලැබීමට හේතුවක් වීම.

**මෙවැනි තත්ත්වයන් මත සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ ස්වාධීන රාජ්‍යය සේවයක් නිර්මාණය විය.**

වාසි - වැදගත්කම - යහපත්භාවය.

(i) අසහනයෙන් තොර රාජ්‍යසේවයක් නිර්මාණය වීම.

එනම්, ආණ්ඩුවේ බලපෑමකින් තොරව රාජ්‍ය සේවකයන්ට ස්වකීය කාර්යයන් සිදු කිරීමට අදාළ අවකාශය හිමි විය.

අවාසි - දුර්වලතාවය - අයහපත්භාවය.

(i) ආණ්ඩුවේ වැඩසටහන් ජනතාවට අතර ක්‍රියාත්මක කිරීමේ දී ඒවා සක්‍රීයව ඩටු නොකර සිටීමට රාජ්‍ය සේවකයන්ට අවකාශය හිමි වීම.

(ii) ආණ්ඩුවේ වැඩ කටයුතු කඩාකප්පල් කිරීමට රාජ්‍ය සේවකයින්ට හැකිවීම.

# අධිකරණය

# අධිකරණය.

- **අධිකරණය හැඳින්වීම.**

වයවස්ථාදායකය විසින් සම්පාදිත විධායකය විසින් ක්‍රියාත්මක නීති විනිශ්චය කිරීම සිදුකරනු ලබන්නේ අධිකරණයයි. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ **ඒකීය අධිකරණ පද්ධතියක් නිර්මාණය කර තිබුණි. මෙම අධිකරණ පද්ධතිය රෝම ලන්දේසි නීතියට හා ඉංග්‍රීසි නීතියට අනුව ස්ථාපනය කර තිබුණි.** නමුත් විවිධ වාර්ගික කොටස් වන **උඩරට සිංහලයන් සඳහා - උඩරට නීතියන් , මුස්ලිම්වරුන් සඳහා - මුස්ලිම් නිතියත්, ද්‍රවිඩයන් සඳහා - තේසවලමේ නීතියත් ක්‍රියාත්මක විය. මෙම නීති බලපෑවේ එම ජන කණ්ඩයම් වල අවාහ විවාහ - දේපල උරුම හිමිකම් ආදී කරණු සම්බන්ධයෙන් පමණි.**

- **අධිකරණ පද්ධතිය තුළ ප්‍රධාන ස්ථර දෙකක් දැකිය හැකිය.**

අධිකරණ පද්ධතිය

1 **උසස් අධිකරණ ආයතන**

2 **පහළ අධිකරණ ආයතන**

## 1. උසස් අධිකරණ ආයතන

උසස් අධිකරණ ආයතන හැඳින්වීම.

සෝල්බරි ආණ්ඩුක්‍රම වයවස්ථාවට අදාළව ක්‍රියාත්මක වූ උසස් අධිකරණ ආයතන වන්නේ, **ශ්‍රේෂ්ඨාධිකරණය - අභියචානාධිකරණය** වැනි අධිකරනයන් ය. මෙම ලංකාවේ ක්‍රියාත්මක වන උසස් අධිකරණ ආයතනයක තීන්දුවට එරෙහිව බ්‍රිතාන්‍යයේ **ප්‍රිවි කවුන්සිලයට (රාජාධිකරණයට)** අභියාචනා ඉදිරිපත් කිරීමට හැකියාව තිබුණි. මෙම අනුව අවසාන අභියාචනාධිකරණ බලය රඳවා තිබුනේ බ්‍රිතාන්‍යය තුලය. එය ලංකාවේ ස්වාධීනත්වයට අවරෝධකයක් විය. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් එය ලංකාවට අර්ධ නිදහසක් (ඩොමේනියන් නිදහසක්) හිමි වූ බව තහවුරු වන සාධකයකි.

## 2.පහළ අධිකරණ ආයතන

පහළ අධිකරණ ආයතන හැඳින්වීම.

සෝල්බරි ආණ්ඩුක්‍රම වයවස්ථාවට අදාළව ක්‍රියාත්මක වූ පහළ අධිකරණ ආයතන වන්නේ, **දිසා අධිකරණය - මහේස්ත්‍රාත් අධිකරණය - රික්වෙස්ට් උසාවිය - ගම්බද උසාවියයි.**

## අධිකරණයේ ස්වාධීනත්වය.

**(N.B ආණ්ඩුවේ ව්‍යුහය tute එකේ අධිකරණය කොටස බලන්න.)**

- **අධිකරණයේ ස්වාධීනත්වය යනු කුමක් දැයි හැඳින්වීම.**

  අධිකරණයේ ස්වාධීනත්වය යනුවෙන් අදහස් කරනු ලබන්නේ ව්‍යවස්ථාදායකයේ හා විධායකයේ බලපෑමකින් - මැදිහත් වීමකින් - ඇඟිලි ගැසීමකින් තොරව අධිකරණයට නීති විනිශ්චය කිරීමට ඇති හැකියාවයි. අධිකරණයේ ස්වාධීනත්වය රටක කටයුතු සාධාරණව සිදුවීමට විශේෂයෙන් බලපායි.

- **අධිකරණයේ ස්වාධීනත්වය ඇති කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග.**

  අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂාකිරීමට පියවර ගනු ලබන ප්‍රධාන අංශ කිහිපයකි.

| | | |
|---|---|---|
| විනිශ්චකාරවරු පත් කරන ආකාරය | - | (පත් කිරීම්) |
| විනිශ්චකාරවරුන්ගේ සේවා කාලය | - | (සේවාකාලය) |
| විනිශ්චකාරවරු ඉවත් කිරීම | - | (ඉවත් කිරීම) |
| විනිශ්චකාරවරුන්ගේ වැටුප් | - | (වැටුප්) |

- **සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ අධිකරණයේ ස්වාධීනත්වය.**

### උසස් අධිකරණ ආයතන වල ස්වාධීනත්වය.

සෝල්බරි ආණ්ඩුක්‍රමයට අදාළව ක්‍රියාත්මක වූ උසස් අධිකරණ වන **ශ්‍රේෂ්ඨාධිකරණය** හා **අභියාචනාධිකරණය** යන අධිකරණ ආයතන වල ස්වාධීනත්වය සම්බන්ධයෙන් ගෙන තිබූ විධි විධාන කිහිපයකි.

**පත් කිරීම** -: උසස් අධිකරණ ආයතනවලට විනිශ්චකාරවරු පත් කරනු ලබන්නේ අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරවරයා විසිනි. **මෙහි දී ජ්‍යෝෂ්ඨත්වය මත විනිශ්චකාරවරු පත් කිරීමේ සම්ප්‍රදායක් පැවතුනි. එම නිසා පත් කිරීම් සම්බන්ධයෙන් ස්වාධීනත්වයක් අපේක්ෂා කළ හැකි විය.**

**සේවා කාලය** -: විනිශ්චකාරවරයකුගේ සේවාකාලය (විශ්‍රාමික වයස) අවුරුදු 62 ක් ලෙස දක්වා තිබුණි. එහෙත් අවශ්‍ය නම් සේවාකාලය අවුරුදු 01 කින් දීර්ඝ කර ගැනීමේ හැකියාව පැවතුනි. සේවා කාලය දීර්ග කිරීමට අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාර වරයාට හැකි විය. මෙය විවේචනයට ලක් වූ කරුණකි. **සේවාකාලය දීර්ග කර ගැනීමේ අරමුණින් ආණ්ඩුවට පක්ෂපාතී තීරණ දීමට විනිශ්චකාරවරු පෙළඹීම ඊට හේතුව විය.**

**ඉවත් කිරීම** -: විනිශ්චකාරවරු ඉවත් කිරීම සඳහා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන් හා සෙනෙට් සභාවෙන් සම්මත වූ යෝජනාවක් මත අග්‍රාණ්ඩුකාරවරයාට හැකි විය.

වැටුප් -: විනිශ්චකාරවරුන්ගේ වැටුප් පාර්ලිමේන්තුව තීරණය කළේ ය. ඒකාබද්ධ අරමුදල මගින් ගෙවන ලදි. සේවාකාලය තුළ වැටුප් අඩු කළ නොහැකි යැයි කොන්දේසි පවරා තිබුණි.

මෙවැනි විධිවිධාන මගින් උසස් අධිකරණ ආයතනවල ස්වාධීනත්වය සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබුණි.

**පහළ අධිකරණ ආයතන වල ස්වාධීනත්වය.**

සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළව ක්‍රියාත්මක වූ පහළ අධිකරණ වන දිසා **අධිකරණය - මහෙස්ත්‍රාත් අධිකරණය - රික්වෙස්ට් උසාවිය - ගම්බද උසාවිය** වැනි අධිකරණ ආයතනවල ස්වාධීන්තවය සම්බන්ධයෙන් විධි විධාන යොදා තිබුණි. එනම්, මෙම අධිකරණ ආයතනවල ,

| | |
|---|---|
| **පත් කිරීම** | **මාරු කිරීම** |
| **ඉවත් කිරීම** | **විනය පාලනය** |

සඳහා **අධිකරණ සේවා කොමිසන් සභාව** යනුවෙන් හැඳින්වෙන ස්වාධීන කොමිසන් සභාවකට පවරා තිබුණි. මෙම **අධිකරණ සේවා කොමිසන් සභාව මගින් පහළ අධිකරණ ආයතනවල ස්වාධීනත්වය ආරක්ෂා විය**.

## අධිකරණසේවා කොමිසන් සභාව.

අධිකරණ සේවා කොමිසන් සභාව හැඳින්වීම.

පහළ අධිකරණ ආයතනවල සාමාජිකයන් පත් කිරීම් - මාරු කිරිම් - ඉවත් කිරීම් සහ විනය පාලනය සඳහා ස්ථාපනය කළ ස්වාධින කොමිසන් සභාව මෙය විය.

අධිකරණසේවා කොමිසන් සභාවේ සංයුතිය.

මෙම කොමිසන් සභාවේ සාමාජිකයන් සංඛ්‍යාව 03 කි. අග්‍රවිනිශ්චයකාරවරයා - ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවකු සහ තවත් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවකු හෝ වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරයකු ලෙස කටයුතු කළ අයෙක් යන තිදෙනෙකුගෙන් කොමිසම සමන්විත වේ.

අගවිනිසුරු + ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවකු + (තවත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවකු)
[ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවකු ලෙස කටයුතු කළ අයෙක්]

අග්‍ර විනිශ්චයකාරවරයා නිලබලයෙන්ම මෙහි සභාපතිවරයා වේ. අනිකුත් සාමාජිකයන් දෙදෙනා අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරවරයා විසින් පත්කරයි.

අධිකරණසේවා කොමිසන් සභාවේ **නිලකාලය**.

අධිකරණ සේවා කොමිසන් සභාවේ සාමාජිකයකුගේ නිල කාලය වසර 05 කි. අග්‍රවිනිශ්චයකාරවරයා හැර අනෙකුත් සාමාජිකයන් **දෙදෙනා** ඉවත් කිරීමට අග්‍රාණ්ඩුකාරවරයාට බලය තිබුණි. නමුත් ඒ සඳහා සාධාරණ හේතු ඉදිරිපත් කළ යුතු විය. මෙම සාමාජිකයන් දෙදෙනාට ඉල්ලා අස්වීමේ හැකියාව තිබුනි.යම් සාමාජිකයකු නිවාඩු ලබාගන්නේ නම් එම කාලය සඳහා වෙනත් සාමාජිකයෙකු පත් කිරීමට අග්‍රාණ්ඩුකරුට හැකි විය.

අධිකරණසේවා කොමිසන් සභාවේ **වේතන (වැටුප්)**

අධිකරණසේවා කොමිසන් සභාවේ සාමාජිකත්වයන්ගේ වැටුප් පාර්ලිමේන්තුව තීරණය කළ යුතු ය. ඒකාබද්ධ අරමුදල මගින් ගෙවිය යුතු ය. සේවාකාලය තුළ වැටුප් අඩු කළ නොහැකිය.

අධිකරණසේවා කොමිසන් සභාවේ **කාර්ය බලතල**.

පහළ අධිකරණ ආයතනවල නිලධාරීන් පත් කිරීම - මාරු කිරීම - ඉවත් කිරීම සහ විනය පාලනය මෙම කොමිසමට අදාළ කාර්ය ක්ෂේත්‍රය විය.

- අධිකරණසේවා කොමිසන් සභාවේ ස්වාධීනත්වය සඳහා ගෙන තිබූ ක්‍රියාමාර්ග

(i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කොමිසමේ සාමාජිකත්වය ලබා නොදීම.

(ii) අමාත්‍යමණ්ඩලයට කොමිසමට බලපෑම් කිරීමට නොහැකි වීම.

(iii) කොමිසමේ සාමාජිකයකු ඉවත් කිරීමට නම් හේතු ඉදිරිපත් කළ යුතු වීම.

(iv) කොමිසමට බලපෑම් කිරීම රු. 1000 ක දඩ මුදලක් හෝ එක් වසර සිරදඩුවමක් හෝ මෙම දඩුවම් දෙකම ලැබීමට හේතුවක් වීම.

(v) අධිකරණ අමාත්‍යවරයා ඡන්දයෙන් පත්වූ මණ්ඩලය වන පාර්ලිමේන්තුවේ සෙනෙට් සභාව තුලින් පත් කිරීම.

**මෙම තත්ත්වය මත සෝල්බරි ආණ්ඩුක්‍රමය තුළ ස්වාධීන අධිකරණ පද්ධතියක් නිර්මාණය විය.**

# සුළු ජාතීන්ගේ රැකවරණ විධිවිධාන

# සු ළු ජාතීන්ගේ රැකවරණ විධි විදාන.

<u>හැඳින්වීම.</u>

සෝල්බරි ආණ්ඩුක්‍රමය මගින් සුළු ජාතීන් ආරක්ෂා කිරීම සඳහා විධිවිදාන රාශියක් ගෙන තිබුණි. සෝල්බරි කොමිසමේ අදහස වූයේ මෙම ආණ්ඩුක්‍රමය මගින් ලංකාවට නිදහස දෙනවිට විශාල බලතල ප්‍රමාණයක් **සිංහලයන් වන මහ ජාතිය** සතු වන බවයි. එම නිසා **ද්‍රවිඩ , මුස්ලිම්** , වැනි සුළු ජාතීන්ට ඇති විය හැකි අනාරක්ෂිත හානිකර තත්ත්වයන් අවම කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම විධිවිදාන සලසා තිබුණි. විශේෂයෙන් ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ යන ත්‍රිවිධ අංශ හරහා සුළු ජාතීන් රැකවරණය සඳහා විධිවිදාන යොදා තිබුණි.

- <u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ව්‍යවස්ථාදායක අංශය හරහා සුළුජාතීන්ගේ රැකවරණය සඳහා ගෙන තිබූ විධිවිදාන</u>.

01. **නීති සම්පාදන බලයට සීමාවන් පනවා තිබීම. 29 (2) - 29 (3)**

සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පාර්ලිමේන්තුවේ නීති සම්පාදන බලයට සීමා පනවා තිබුණි. 29(2) උපවගන්තිය මගින් දක්වා තිබුණේ කිසියම් ආගමකට - වර්ගයකට - ජන කණ්ඩායමකට වරප්‍රසාද දෙන නීති පාර්ලිමේන්තුවට සම්පාදනය කළ නොහැකි බවයි. මෙම නීතිය 29 (3) උපවග්නිතය මගින් තවදුරටත් ශක්තිමත් කර තිබුණි. එමගින් ප්‍රකාශිත වන්නේ පාර්ලිමේන්තුව එවැනි නීතියක් සකස් කරන්නේ නම් එය ස්වයංක්‍රීයවම නිශේධනය වන බවයි. මෙම තත්ත්වයන් නිසා සිංහලයන් වන මහ ජාතියට තමන්ට වරප්‍රසාද ලැබෙන නීති සකස් කර ගැනීමට නොහැකි විය. එය සුළු ජාතීන් ආරක්ෂා කිරීම සඳහා ගෙන තිබූ විධිවිදානයකි.

| | **29 (2) උපවගන්තිය - 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.** |
|---|---|
| (අ) | කවර ආගමක් වුවද නිදහසේ ඇදහීම තහනම් කිරීම හෝ සීමා කිරීම නොකළ යුතුය; **නැතහොත්** |
| (ආ) | කවර ජන සමූහයක් හෝ ආගමික පුද්ගලයන් අනෙකුත් ජන සමූහවල හෝ ආගම් වල හෝ පුද්ගලයන් පාත්‍ර නොවූ දුෂ්කරතාවන්ට හෝ සීමාවන්ට පාත්‍ර නොකළ යුතුය; **නැතහොත්** |
| (ඇ) | කවර ජන සමූහයක හෝ ආගමික පුද්ගලයන්ට නොපැවරූ වරප්‍රසාද හෝ පහසුකමක් අනෙකුත් ජන සමූහවල හෝ ආගම් වලට අයත් පුද්ගලයන්ට නොපැවරිය යුතු ය. **නැතහොත්** |
| (ඈ) | කිසියම් ආගමක සංස්ථාවක ව්‍යවස්ථාවක් එහි පාලක මණ්ඩලයේ අනුමැතිව ඇතිව මිස වෙනස් නොකළ යුතු ය. එයත් යම් කිසි ආගමික සංස්ථාවක් නීති මගින් සංස්ථාපනය කර ඇති කල්හි එහි පාලක මණ්ඩලයේ ඉල්ලීමක් අනුව මිස වෙනස් නොකළ යුතු ය. |

> **29 (3) උප වගන්තිය - 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**
>
> 29 වෙනි වගන්තියේ (2) වෙනි උප වගන්තියෙන් දැක්වූ විධිවිධානයන්ට පටහැනිව පනවන පනත් නිෂ්ප්‍රභා වන්නේ ය.

02. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය අනම්‍ය පදනමක ස්ථාපනය කර තිබීම.**

විශේෂයෙන් **29 (2) - 29 (3)** වගන්ති සංශෝධනය සඳහා ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවේ නොපැමිණි මන්ත්‍රීවරුන් ඇතුළුව (2/3) ක විශේෂ බහුතරයකින් සම්මත කරන ලද පනත් කෙටුම්පතකට අග්‍රාණ්ඩුකාරවරයාගේ අනුමැතිය අවශ්‍ය විය. මෙම තත්වයන් **29(4)** වගන්තිය තුළ දක්වා තිබුණි. මෙම විධිවිදානය නිසා ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවේ සුළු ජාතික මන්ත්‍රීවරුන්ගේ එකඟතාවයකින් තොරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට සිංහල මහ ජාතික මන්ත්‍රීවරුන්ට නොහැකි විය. මේ ආකාරයට 29(2) 29(3) වගන්ති 29(4) වගන්තිය මගින් තවදුරටත් ශක්තිමත් කර තිබුණි. එය සුළු ජාතීන්ගේ රැකවරණය සඳහා ගෙන තිබූ ක්‍රියාමාර්ගයකි.

> **29(4) උපවගන්තිය - 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**
>
> 29(2) 29(3) වගන්ති සංශෝධනය කිරීම සඳහා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ නොපැමිණි මන්ත්‍රීන් ද ඇතුළුව (2/3) ක බහුතර ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද ව්‍යවස්ථා කෙටුම්පතක්. එසේ සම්මත කර ගන්නා ලද බවට කථානායකවරයාගේ අත්සන සහිත සහතිකයක් රාජකීය අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමෙන් එම විධි විධාන සංශෝධනය කිරීමට හෝ පරිච්චින්න කිරීමට හෝ හැකි වන්නේ ය.
>
> **(N.B)** *මෙලෙස ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා 2/3 ක විශේෂ බහුතරයක් ඒකාග්‍රතාවයක් ඇතිකර ගැනීම සිතිය නොහැකි තරම් දුෂ්කර කරුණක් විය. ඊට හේතුව වන්නේ එම යුගය තුළ දේශපාලන පක්ෂ තුළ පැවති අසංවිධානාත්මක භාවයයි.*

3. **සුළු ජාතීන් වෙනුවෙන් ව්‍යවස්ථාදායකයට මන්ත්‍රීවරුන් ඇතුලත් කිරීම.**

- <u>අග්‍රාණ්ඩුකාරවරයා විසින් නාමකරණයෙන් සුළුජාතීන් වෙනුවෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට සාමාජිකයන් (6) ක් පත් කිරීම.</u>

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව, "**මහ මැතිවරණයකින් පසුව දිවයිනේ වැදගත් ප්‍රජාංශයක් නියෝජනය වී නැතැයි අග්‍රාණ්ඩුකාරවරයා සිතන්නේ නම් එම ජනවර්ගයන් වෙනුවෙන් ව්‍යවස්ථාදායකයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට මන්ත්‍රීන් වශයෙන් හයකට (06) නො වැඩි පුද්ගල සංඛ්‍යාවක් එතුමාට පත් කළ හැකිය.**" මෙම විධිවිදානය මගින් අපේක්ෂා කළේ මහ මැතිවරණයක දී ප්‍රමාණවත් ලෙස නියෝජනය නොවූ සුළුතරය වෙනුවෙන් ව්‍යවස්ථාදායකය තුළ නියෝජනයක් ලබා දීමයි.

- <u>සෙනෙට් සභාවට මන්ත්‍රීවරු පත් කරන විට සුළු ජාතීන්ට නියෝජනයක් ලැබෙන ලෙස එම පත් කිරීම් සිදු කිරීම</u>.

සෙනෙට් සභාව හෙවත් උත්තර මන්ත්‍රී මණ්ඩලය සාමාජිකයින් 30 කින් සමන්විතය. ඉන් 15 දෙනෙක් නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුළ ඇති දේශපාලන පක්ෂ විසින් ද 15 ක් අග්‍රාණ්ඩුකාරවරයා අගමැතිගේ උපදෙස් පිට පත් කරනු ලබයි. මෙම සභාව ස්ථාපනය කිරීමේ <u>මූලික</u> <u>අරමුණ වූයේ</u> නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ හදිසියේ නීති සම්පාදන ක්‍රියාවලියට අවරෝධකයක් ලෙසින් ක්‍රියාත්මක වීමයි. සෙනෙට් සභාව පිහිටු වීමේ <u>අතුරු අරමුණක් බවට පත්ව</u> <u>තිබුනේ</u> සුළුතර ජනකොටස් වලට නියෝජනයක් සැපයීමයි.

4. **බහු මන්ත්‍රී ඡන්දකොට්ඨාස (මැතිවරණ කොට්ඨාස) පිහිටුවීම.**

යම් ප්‍රදේශයක ප්‍රධාන ජන වර්ගයට අමතරව තවත් සුළු ජනවර්ග ජීවත් වෙයි නම් එම ජනවර්ග වලට ද නියෝජනයක් ලැබෙන සේ එම ජන්දකොට්ඨාස බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාස ලෙස නිර්මාණය කිරීම. බහු <u>මන්ත්‍රී ඡන්ද කොට්ඨාස 05 ක් පිහිටුවා තිබුණි.</u>

5. **මැතිවරණ කොට්ඨාස බෙදන විට වර්ග සැතපුම් පදනම සැලකිල්ලට ගැනීම.**

මැතිවරණ කොට්ඨාස බෙදා වෙන් කරන විට වර්ග සැතපුම් පදනම ද සැලකිල්ලට ලක් කළේ ය. විශේෂයෙන් වර්ග සැතපුම් පදනම මත මහ මැතිවරණ කොට්ඨාස බෙදා වෙන් කළේ සුළු ජාතීන් බහුල වශයෙන් ජීවත් වන **උතුර - උතුරු** මැද **නැගෙනහිර** වැනි පලාත් වලය. මෙහි අරමුණ බවට පත්ව තිබුණේ සුළු ජාතික මන්ත්‍රීවරු වැඩි පිරිසක් ව්‍යවස්ථාදායකයට ඇතුලත් කර ගැනමයි.

මෙම පදනම මත ව්‍යවස්ථාදායකයට සුළු ජන කොටස් වන නියෝජිතයන් තේරී පත් වුවද එම මන්ත්‍රීවරුන්ට ස්වධීනව කටයුතු කිරීමේ අවකාශය නොලැබුණි.

**නිදර්ශන -:** යුරෝපීන් වෙනුවෙන් පත් කළ මන්ත්‍රී ඊ.එෆ් ග්‍රේෂන්ට පාර්ලිමේන්තුවෙන් ඉවත් වීමට වීම.

- <u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් **විධායක අංශය** හරහා සුළු ජාතීන්ගේ රැකරවණය</u> <u>සඳහා ගෙන තිබූ විධිවිදාන</u>.

1. **අමාත්‍ය මණ්ඩලයට සුළු ජාතික අමාත්‍යවරු පත් කිරීම.**

අමාත්‍යය මණ්ඩලයට අමාත්‍යවරුන් පත් කරන විට සුළු ජාතීන් වෙනුවෙන් අමාත්‍යවරු දෙදෙනෙක් (02) වත් පත් කරන බවට ඩී.එස්. සේනානායක මහතා සෝල්බරි කොමිසමට පොරොන්දු වී තිබීම. එහි ප්‍රතිඵලයක් ලෙස අමාත්‍ය මණ්ඩලයට සුළු ජාතික අමාත්‍යවරුන් පත්කර තිබුණි.

**නිදර්ශන -:** <u>1947 ඩී.එස්. සේනානායක ගේ කැබිනට් මණ්ඩලය.</u>

මෙහි සාමාජිකයන් 14 කි.




1952 ඩඩ්ලි. සේනානායක ගේ කැබිනට් මණ්ඩලය
මෙහි සාමාජිකයන් 14 කි




2. **රාජ්‍ය සේවා කොමිසන් සභාව හරහා රාජ්‍ය සේවය ස්වාධීන කර තිබීම.**

මෙම කොමිසන් සභාව ස්ථාපිත කිරීමේ මුඛ්‍ය අරමුණ වූයේ රාජ්‍යය සේවය දේශපාලන සම්බන්ධතාවයකින් තොරව ස්වාධීනව පවත්වාගෙන යාමයි. එහි වක්‍ර උපයෝගීතාවය බවට පත් වූයේ රාජ්‍ය සේවය සම්බන්ධයෙන් සුළු ජාතීන්ට සාධාරණයක් ඉටු වීමයි.

■ <u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අධිකරණ අංශය හරහා සුළු ජාතීන්ගේ රැකවරණය</u> සඳහා ගෙන තිබූ විධිවිධාන.

1. **අධිකරණ අමාත්‍යවරයා සෙනෙට් සභාව තුලින් පත් කිරීම.**

2. **අධිකරණ සේවා කොමිසන් සභාව හරහා පහළ අධිකරණ ස්වාධීන කර තිබීම.**
(**N.B** - මීට පෙර විස්තර දක්වා තිබේ.)

3. **අධිකරණ විමර්ශන බලය**
(**N.B** - මීට පෙර විස්තර දක්වා තිබේ.)

මෙම ආකාරයට සුළු ජාතීන්ගේ රැකවරණය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ යන ත්‍රිවිධ අංශ ඔස්සේ විධිවිදාන සලසා තිබුණි. සුළු ජාතීන් උදෙසා මෙතරම් විධිවිධාන සලසා තිබීම සම්බන්ධයෙන් විවේචන ද එල්ලවී තිබේ. මෙම දුර්වලතාවය මඟ හරවමින් 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ඇතුලත් කර තිබේ.

## සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ කැබිනට් ක්‍රමය වර්ධනය වූ ආකාරය.

1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය මගින් ලංකාවට කැබිනට් ක්‍රමය ප්‍රථම වරට හඳුන්වා දෙන ලදි. අනතුරුව කැබිනට් ක්‍රමය ක්‍රමානුකූලව වර්ධනය විය.

- **කැබිනට් ක්‍රමයක් යනු කුමක්දැයි අර්ථ නිරූපණය කිරීම.**

කැබිනට් ක්‍රමයක් යනුවෙන් අර්ථ නිරූපණය වන්නේ ව්‍යවස්ථාදායකය තුලින් තෝරාගත් කැබිනට් මණ්ඩලයක් විධායක කටයුතු සිදුකරන ආණ්ඩු ක්‍රමයක් ය.

- **කැබිනට් ආණ්ඩුක්‍රමයක ලක්ෂණ.**

  - ව්‍යවස්ථාදායකය තුලින් විධායකය තෝරා ගැනීම.
  - විධායකයන් දෙකක් පැවතීම.
  - විධායක කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායකයට සාමූහිකව වගකීම.
  - ව්‍යවස්ථාදායකය විසුරුවා හැරීමට විධායකයට හැකි වීම.
  - විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකි වීම.
  - රාජ්‍යයේ නායකයා විසින් ආණ්ඩුවේ නායකයා තෝරා ගැනීම.
  - ව්‍යවස්ථාදායකයේ ආධිපත්‍යයක් පැවතීම.
  - පක්ෂ ක්‍රමයක පැවැත්ම.

- **සෝල්බරි ආණ්ඩුක්‍රමය කැබිනට් ක්‍රමයක් බව හඳුනා ගැනීම.**

සෝල්බරි ආණ්ඩුක්‍රමය තුළ ඉහතින් සඳහන් කළ කැබිනට් ක්‍රමයක ලක්ෂණ ක්‍රියාත්මක වූ නිසා එය කැබිනට් ක්‍රමයක් ලෙස හඳුනාගත හැකිය. ලංකාවේ ප්‍රථම වරට කැබිනට් ක්‍රමයක් ස්ථාපනය වන්නේ සෝල්බරි ආණ්ඩුක්‍රමය තුළිනි.

- **සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ කැබිනට් ක්‍රමය වර්ධනය වීම හ ඊට බලපෑ හේතු සාධක.**

සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ කැබිනට් ක්‍රමය හඳුන්වා දුන් අතර එය වර්ධනය වීම ද සිදුවිය. කැබිනට් ක්‍රමයක් වර්ධනය වීම සඳහා අවශ්‍ය සාධක.

- පක්ෂ ක්‍රමය
- ද්විපක්ෂ ක්‍රමය
- විෂයානුකූල බැඳීම
- සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය.

**පක්ෂ ක්‍රමය**

1947 සෝල්බරි ආණ්ඩුක්‍රමයට පෙර පැවති ආණ්ඩුක්‍රමය වූයේ ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යි. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ ආරම්භකරන මුල් අවධිය තුළ ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයක් නොව දේශපාලන පක්ෂයක් වත් පැවතියේ නැත. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය මගින් සර්ව ජන ඡන්ද බලය ප්‍රදානය කිරීම ලංකාවේ දේශපාලන පක්ෂ උත්පාදයට අදාළ ආසන්න ප්‍රබලම හේතුව විය. මෙම තත්වය මත ජනතාවගේ ඡන්ද ලබාගැනීමේ අරමුණින් කිසියම් ප්‍රතිපත්ති මාලාවක් යටතේ සංවිධාන ගත වූ සමාජ කණ්ඩායම් නිර්මාණය විය. එම කණ්ඩායම් දේශපාලන පක්ෂ ලෙස හැඳින්විය හැකිය. ලංකාවේ ප්‍රථම දේශපාලන පක්ෂය වන්නේ 1935 දී නිර්මාණය කළ ලංකා සම සමාජ පක්ෂය යි.

මෙම ආකාරයට ඩොනමෝර් ආණ්ඩුක්‍රමය තුළ දේශපාලන පක්ෂ නිර්මාණය විය. නමුත් පක්ෂ ක්‍රමයක් නිර්මාණය නොවීය.

| |
|---|
| **පක්ෂ ක්‍රමය අර්ථ නිරූපණය,**<br>**පක්ෂ ක්‍රමයක් යනු, ආණ්ඩු බලය දිනාගැනීමේ අරමුණ මත දේශපාලන පක්ෂ අතර ඇති වන සක්‍රීය - තරගකාරී උනන්දුවයි.** |

ඩොනමෝර් ක්‍රමය තුළ පැවති විධායක කාරකසභා ක්‍රමය තුළ ව්‍යවස්ථාදායකයේ සියලුම සාමාජිකයන් විධායක කටයුතු වලට සම්බන්ධ විය. එම නිසා විශේෂයෙන් ආණ්ඩු බලය අත්පත් කර ගැනීමේ අරමුණින් පක්ෂ සංවිධානය නොවීය. එනම්, පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක නොවිය. <u>එම නිසා 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය තුළ දේශපාලන පක්ෂ පැවතිය ද පක්ෂ ක්‍රමයක් ශක්තිමත්ව ක්‍රියාත්මක නොවීය.</u> ඩොනමෝර් ආණ්ඩුක්‍රමය තුළ පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වීමට අදාළ වාස්ථවික තත්වයන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම ලොප් කර තිබුණි.

<u>සෝල්බරි ආණ්ඩුක්‍රමය තුළ පක්ෂ ක්‍රමයේ ඇරඹීය සහ වර්ධනය සිදු විය</u>. එයට හේතු වූයේ ආණ්ඩු බලය දිනාගැනීමේ අවශය තාවයයි. කැබිනට් ක්‍රමයක් වන සෝල්බරි ආණ්ඩුක්‍රමය තුළ විධායක බලය හිමි වූයේ ව්‍යවස්ථාදායකය තුළ වැඩිම ආසන ගනනක් හිමි කර ගන්නා දේශපාලන පක්ෂයට පමණි. එම නිසා ආණ්ඩුවේ බලය අත්පත් කර ගැනීමේ අරමුණින් පක්ෂ සංවිධාන ගත විය. එම නිසා පක්ෂ ක්‍රමය වර්ධනය විය.

**නිදර්ශන -:** 1946 දී එක්සත් ජාතික පක්ෂය බිහිවීමත (ඩී.එස්. සේනානායක)
1951 ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරණායක)
කොමියුනිස්ට් පක්ෂය
සම සමාජ පක්ෂය
බොල්ෂවික් ලෙනිනිස්ට් පක්ෂය

**<u>ද්විපක්ෂ ක්‍රමය</u>**

කැබිනට් ක්‍රමක් සාර්ථකව ක්‍රියාත්මක වීම සඳහා ද්විපක්ෂ ක්‍රමය අත්‍යවශ්‍ය මූලධර්මයකි.

| |
|---|
| **ද්වී පක්ෂ ක්‍රමය අර්ථ නිරූපණය ,**<br>**"ද්වි පක්ෂ ක්‍රමය යනු ප්‍රධාන පක්ෂ දෙකක ආධිපත්‍යය සහිත පක්ෂ ක්‍රමයකි."**<br>**"ආණ්ඩුවේ බලය දිනා ගැනීමට තරම් ශක්තිමත් පක්ෂ දෙකක් පැවතීම අර්ථවත් වේ නමුත් ඊට අමතරව අවශේෂ පක්ෂයන් ද පැවතිය හැකිය."** |

<u>1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ ද්විපක්ෂ ක්‍රමයක ක්‍රියාත්මක නොවුණද ඊට ආසන්න පක්ෂ ක්‍රමයක් වන ද්වි සහාග පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක විය</u>.

සෝල්බරි අවදිය තුළ එක්සත් ජාතික පක්ෂය - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය - ලංකා සමසමාජ පක්ෂය - කොමියුනිස්ට් පක්ෂය ආදී වූ පක්ෂ රාශියකි. ඒ අතුරින් **<u>එක්සත් ජාතික පක්ෂයත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් කැපීපෙනෙන ඉදිරිගාමී දේශපාලන පක්ෂ බවට පත් විය.</u>**

1947 සෝල්බරි අවධිය තුළ මෙම පක්ෂ දෙක කේන්ද්‍ර කරගනිමින් අනෙකුත් පක්ෂවල සහයෝගය මත සභාග ආණ්ඩු නිර්මාණය කිරීම දක්නට ලැබුණි. එම නිසා එම අවධිය තුළ **එක්සත් ජාතික පක්ෂය හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කේන්ද්‍රකරගත් ද්වි සභාග පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක විය.** එය ද්විපක්ෂ ක්‍රමය තරම්ම කැබිනට් ක්‍රමයේ සාර්ථකත්වයට හේතු නොවූව ද කිසියම් ප්‍රමාණයකට කැබිනට් ක්‍රමයේ වර්ධනයට හේතු විය.

**ද්වි සභාග පක්ෂ ක්‍රමය අර්ථ නිරූපණය,**

> **සරලව ද්වි සභාග පක්ෂ ක්‍රමය යනුවෙන් හඳුන්වනු ලබන්නේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකක් අවශේෂ සෙසු පක්ෂ සමග සන්ධාන ගත වී නිර්මාණය කර ගනු ලබන පක්ෂ සාමූහිකත්වයකටය.**

**ලංකාවේ ද්වි සභාග පක්ෂ ක්‍රමයට නිදසුන්,**

| | |
|---|---|
| (1946) එක්සත් ජාතික පක්ෂය නිර්මාණය වීමට අදාළ පක්ෂ සන්ධාන | එක්සත් ජාකිත පක්ෂය + ලංකා ජාතික සංගමය + සිංහල මහා සභාව + සමස්ත ලංකා මුස්ලිම් සංගමය + ද්‍රවිඩ නායකයන් (නඩේෂන් - ඒ. මහදේව) |
| (1956) මහජන එක්සත් පෙරමුණ | ශ්‍රී ලංකා නිදහස් පක්ෂය + විප්ලවකාරී සමසමාජ පක්ෂය + භාෂා පෙරමුණ + ස්වාධීන අපේක්ෂකයන් 8 යි. |

## විනයානුකූල බැඳීම.

කැබිනට් ක්‍රමයක් ක්‍රියාත්මක වීම සඳහා පක්ෂ ක්‍රමයක් පැවතිය යුතු ය. පක්ෂ ක්‍රමය සාර්ථක වීමට පක්ෂ තුළ විනයානුකූල බැඳීම ශක්තිමත් විය යුතු ය.

**විනයානුකූල බැඳීම අර්ථ නිරූපණය,**

> **විනයානුකූල බැඳීම යනු කුමක්දැයි සරලව නිර්වචනය කරන්නේ නම්, පක්ෂ සාමාජිකයන් පක්ෂ ප්‍රතිපත්ති වලට සහ පක්ෂ නායකයාට අවනත වෙමින් පක්ෂයේ විනයට අනුව කටයුතු කිරීමට බැඳී සිටීමයි.**

මෙම විනයානුකූල බැඳීම සෝල්බරි කැබිනට් ක්‍රමයේ මුල් අවස්ථාව තුළ හොඳින් ආරක්ෂා වී නොමැත.

## ■ සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය.

සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය කැබිනට් ක්‍රමය සාර්ථකවීම අවශ්‍ය ප්‍රධානම මූලධර්මය වේ.

**සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය අර්ථ නිරූපණය.**

**කැබිනට් මණ්ඩලය තුළ සිටින අමාත්‍යවරුන් සාමූහිකව ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවට වගකිවයුතු බව මින් ප්‍රකාශිතය. තව දුරටත්, කැබිනට් අමාත්‍යවරු සාමූහිකව, මිත්‍ර ශීලීව සගයන් මෙන් කටයුතු කරමින් කැබිනට් මණ්ඩලයේ කාර්යයක්ෂමතාවය - රහස්‍යභාව - ගෞරවය - ශක්තිය - සුරක්ෂිත භාවය ඉන් සංකේතවත් වේ.**

මෙම සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ සතුටු දායක මට්ටමකින් ක්‍රියාත්මක වූ බවක් හඳුනා ගත නොහැකිය.

නිදර්ශන -: 1947 මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂ සහාග ආණ්ඩුවක් නිර්මාණය කළේ ය. මේ ආණ්ඩුව තුළ සිටි **සී. සුන්දරලිංගම් - සී. සිත්තම්පලම් - ර්. ඒ. ගුණසිංහ** වැනි සාමාජිකයන් තමන් එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයන් නොවන බව ප්‍රසිද්ධියේ කියා සිටීම.

චීන - රබර් සහල් ගිවිසුම වෙළෙඳ ඇමති **ආර්.ජී. සේනානායක** අත්සන් කළ විට මුදල් ඇමති **ජේ.ආර් ජයවර්ධන** විවේචනය කළේ ය.

**සී. සුන්දරලිංගම්** ඉන්දු - පාකිස්ථාන පුරවැසි පනතට විරුද්ධව කටයුතු කිරීම.

1947 කැබිනට් මණ්ඩලය තුළ **එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක** මහතාගේ ක්‍රියා කලාපය.

මෙම ආකාරයට 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය තුළින් කැබිනට් ක්‍රමය ආරම්භ වී කිසියම් දුරකට වර්ධනය වන ආකාරය හඳුනාගත හැකිය.

- **සෝල්බරි ආණ්ඩුක්‍රමය තුළ ක්‍රියාත්මක වූ කැබිනට් මණ්ඩලය , එහි තත්ත්වයන් සහ විකාශනය.**

**1947 - 1952 ප්‍රථම කැබිනට් මණ්ඩලය**

මෙම කැබිනට් මණ්ඩලය තුළ අගමැති ධූරය හෙබවූයේ **ඩී.එස්. සේනානායක** මහතා විසිනි. කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන් ප්‍රමාණය 14 කි. එහි ව්‍යුහය.




මෙම කැබිනට් මණ්ඩලයේ බලය එක්සත් ජාතික පක්ෂය අත්පත් කොටගෙන තිබුණි. එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුබලය අත්පත් කර ගැනීම සඳහා විවිධ පක්ෂ හා කණ්ඩායම්වල සහාගයකට එළඹ තිබුණි.

**නිදර්ශන -:** ලංකා ජාතික සංගමය
සිංහල මහා සභාව
සමස්ත ලංකා මුස්ලිම් සංගමය
ද්‍රවිඩ නායකයන්

මෙම තත්ත්වය මත ඩී.එස්. සේනානායකට කැබිනට් මණ්ඩලය නිර්මාණය කරන විට මෙම පක්ෂ හා විවිධ කණ්ඩායම් වලට නියෝජනයක් ලබා දීමට සිදු විය. එම නිසා සෝල්බරි කොමිසම විසින් දක්වා තිබුණු කැබිනට් සාමාජිකයන් 10 යේ සීමාව ඉක්මවා සාමාජිකයන් 14 ක් පත් කිරීමට සිදු විය. මෙම තත්ත්වය මත කැබිනට් මණ්ඩලය තුළ සාමූහික වගකීම හා විනයානුකුල බැඳීම මධ්‍යගත සැලසුම් කරණය ශක්තිමත් නොවීය.

**නිදර්ශන -:** **සී. සුන්දරලිංගම් , සී. සිත්තම්පලම් , ඊ.ඒ. ගුණසිංහ** ආදීන් තමන් එක්සත් ජාතික පක්ෂ සාමාජිකයින් නොවන බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීම.

වෙළෙඳ ඇමති **සී. සුන්දරලිංගම්** ඉන්දු පාකිස්ථාන පුරවැසි පනතට ඉතා දැඩිව විරුද්ධ වීම. එම නිසා ඔහු කැබිනට් මණ්ඩලයෙන් ඉල්ලා අස්වීම.

**ඩී.එස්. සේනානායක** මහතා විසින් කැබිනට් මණ්ඩලයේ සාමූහික වගකීම ආරක්ෂා කිරීමේ වැදගත්කම සම්බන්ධයෙන් ලියවුණු **පත්‍රිකාවක්** කැබිනට් සාමාජිකයන් අතර බෙදා හැරීම.

ආණ්ඩුවේ ප්‍රතිපත්ති ඉතා දැඩිව **එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක** මහතා විසින් විවේචනය කිරීම. බණ්ඩාරනායක මහතා කැරලිකාර නායකයකු ලෙසින් මතු වී ආණ්ඩුවේ වැඩ කටයුතු විවේචනය කළේ ය. ආණ්ඩුවේ සමාජ ආර්ථික - දේශපාලන ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ඔහුට දැඩි විවේචනයක් පැවතින. ඔහු එය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේ ය. ග්‍රාමීය ජනතාවගේ සහයෝගය ආණ්ඩුව ලබා ගැනීම සඳහා ඔවුන්ගේ සංස්කෘතික - භාෂා - ආර්ථික ඕනෑකම් දේශපාලනය ඇතුලත් කරගටත යුතු බව ඔහුගේ විශ්වාසය විය. බණ්ඩාරනායක උපතින්ම උරුම වූ ක්‍රිස්තියානි ආගම අතහැර බෞද්ධ ආගම වැළඳ ගැනීම - ආර්ය සිංහල ඇඳුමට හුරුවීම- සිංහල බස තමන්ගේ දේශපාලන බස කරගැනීම. මෙම තත්ත්වය මත සඟ , වෙද , ගුරු , ගොවි , කම්කරු යන පංච මහා බලවේග වල සහාය ඔහුට හිමිවීම. එම නිසා පොදු ජනතාවගේ මිනිසා බවට පත්විය. ඔහු සිංහල මහා සභාව ගොඩ නගා තිබුණි. මෙවැනි මතවාද කැබිනට් මණ්ඩලය තුළ ද සිටිමින්ම එස්.ඩබ්ලිව් ප්‍රසිද්ධියේ සාච්ඡා කිරීම නිසා කැබිනට් මණ්ඩලය තුළ තිබිය යුතු සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය බිඳ වැටුණි. බණ්ඩාරනායක කැබිනට් මණ්ඩලය තුළ ද ඉන් පිටතත් ක්‍රියා කළ ආකාරය සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය මුළු මනින්ම පටහැනි විය.

**ඊ.ඒ ගුණසිංහ** ආණ්ඩුවේ ලාංකීය කරණය පිළිබඳ ප්‍රතිපත්තිය ප්‍රසිද්ධිය විවේචනය කිරීම.

කර්මාන්ත හා ධීවර ඇමති **ජී. ජී. පොන්නම්බලම්** ගේ ප්‍රතිපත්ති ද කැබිනට් ඇමතිවරුන්ගේ විවේචනයට ලක් විය.

| 1952 මාර්තු - මැයි | දෙවන කැබිනට් මණ්ඩලය |
|---|---|

1952 මාර්තු සිට මැයි දක්වා අතර කාලය තුළ භාරකාර ආණ්ඩුවක් ලෙසින් ක්‍රියාත්මක වූ **ඩඩ්ලි සේනානායකගේ** කැබිනට් මණ්ඩලය තුළ සාමූහික වගකීම කිසියම් ප්‍රමාණයකින් ආරක්ෂා විය. එහි සාමාජිකයින් ප්‍රමාණය 14 කි.




| 1952 - 1956 | තෙවන කැබිනට් මණ්ඩලය. |
|---|---|

1952 පවත්වන ලද මැතිවරණයෙන් **ඩඩ්ලි සේනානායක** මහතාගේ නායකත්වයෙන් තෙවන කැබිනට් මණ්ඩලය සකස් විය. විපක්ෂය බෙදී පැවතීමත් ඩී.එස්. සේනානායක මහතාගේ අභාවයෙන් පසු බහුතර ජනතාව තුළ ඔහු කෙරෙහි ඇති වූ කම්පනයත් හේතු කොටගෙන පාර්ලිමේන්තුවේ නියත බහුතරයක් සමගින් එක්සත් ජාතික පක්ෂය බලයට පත්විය. **ඩඩ්ලි සේනානායක මහතාට කැබිනට් මණ්ඩලය තුළ හිමි වූ ස්ථානය ශක්තිමත හා සුරක්ෂිත එකක් නොවුනි.** එමෙන්ම එම කැබිනට් මණ්ඩලය තුළ ද සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය ආරක්ෂා වූයේ නැත.

**නිදර්ශන -:** ඇමති ඩඩ්ලි සේනානායක සහ කැබිනට් මණ්ඩලයේ ඇතැම් අමාත්‍යවරුන් විවේචනය කරමින් '**අගමැති පොරය**' (Priministor Stakes) නමින් පොතක් පලවීම.

චීනය සමග ඇතිකර ගැනීමට යෝජනා කර තිබූ රබර් සහල් ගිවිසුමට එරෙහිව මුදල් ඇමති **ජේ.ආර්. ජයවර්ධන** කටයුතු කිරීම.

මෙම තත්ත්වය මත අගමැති ඩඩ්ලි සේනානායක අගමැති ධූරයෙන් ඉල්ලා අස්විය. ඉන් අනතුරුව අගමැතිවරයා ලෙස **සර් ජොන් කොතලාවල** තේරී පත් විය. කොතලාවලගේ කැබිනට් මණ්ඩලය තුළ සාමාජිකයන් 14 කි. එම කැබිනට් මණ්ඩලය තුළ ද සාමූහික වගකීම විනයානුකූල බැඳීම ආරක්ෂා වූයේ නැත.

නිදර්ශන -: රාජ්‍ය භාෂාව වශයෙන් සිංහල පමණක් තෝරාගැනීම සම්බන්ධයෙන් **කන්දයියා වෛත්‍යනාථන්** මෙන්ම **එස්.නඩේෂන්ට** විරුද්ධ වීම. මේ නිසා නඩේෂන් කැබිනට් මණ්ඩලයෙන් ඉල්ලා අස්විය.

ඉන්දු ලංකා ප්‍රශ්නය සම්බන්ධයෙන් **සර් කන්දයියා වෛත්‍යනාතන්** ගේ විවේචන.

| 1960 - 1965 | හත්වන කැබිනට් මණ්ඩලය. |
|---|---|

මෙම කැබිනට් මණ්ඩලයේ නායකත්වය **සිරිමාවෝ බණ්ඩාරනායක** මැතිනිය හෙබවූවේ ය. මෙම කැබිනට් මණ්ඩලය තුළ කිසියම් සාමූහිකභාවය ස්ථාපනය වී තිබුණ ද මුදල් ඇමති **ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක** මහතා සම්බන්ධයෙන් කැබිනට් අමාත්‍යවරුන්ට විවේචන පැවතුණි. **සහල් සලාක** ප්‍රශ්නය මත මුදල් ඇමති ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක සහ කැබිනට් සාමාජිකයින් අතර අර්බුදය උග්‍රවිය. එහි ප්‍රතිඵලය වූයේ ඔහුට මුදල් අමාත්‍යධූරයෙන් ඉල්ලා අස්වීමට සිදු වීමයි.

| 1965 - 1970 | අට වන කැබිනට් මණ්ඩලය |
|---|---|

මෙහි අගමැතිවරයා බවට පත්වූයේ **ඩඩ්ලි සේනානායක** මහතාය. මෙම අගමැති වරයා සහ පලාත් අමාත්‍ය ධූරය දැරූ **චෙල්වනායගම්** අතර කිසියම් මතභේදාත්මක ගැටුමක් පැවතිණි.

ඉහත ආකාරයට 1947 - 1970 දක්වා ක්‍රියාත්මක වූ කැබිනට් මණ්ඩලය සහ ඊට අදාළ වර්ධන තත්ත්වයක් විග්‍රහකළ හැකිය. කැබිනට් ක්‍රමයේ වර්ධනයට පැවති අවරෝධකයන් කිහිපයක් හඳුනාගත හැකිය.

1. **සහාග ආණ්ඩු නිර්මාණය වීම.**
2. **ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය තුළ අමාත්‍යවරුන්ට ලැබී තිබූ කේවලත්වය සම්බන්ධ අද්දැකීම.**
3. **කැබිනට් ක්‍රමය ආධුනික පාලන ක්‍රමයක් වීම.**
4. **ද්විපක්ෂ ක්‍රමයක් ශක්තිමත්ව ක්‍රියාත්මක නොවීම.**
5. **කැබිනට් මණ්ඩලය තුළ බහුවාර්ගික හැඩයක් පැවතීම.**

# පක්ෂ ක්‍රමය

## ප ක්ෂ ක්‍රමය වර්ධනය වූ ආකාරය.

• පක්ෂ ක්‍රමයක් යනු කුමක් දැයි අර්ථකතනය කිරීම.

| |
|---|
| **පක්ෂ ක්‍රමයක් යනු, ආණ්ඩුබලය දිනාගැනීමේ අරමුණින් දේශපාලන පක්ෂ කිහිපයක් අතර ඇතිවන සක්‍රීය තරගකාරී උනන්දුවයි.** |

• 1947 පූර්ව අවධිය තුළ පක්ෂ පැවතිය ද පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක නොවූ බව.

1947 සෝල්බරි ආණ්ඩුක්‍රමයට පෙර පැවති **ඩොනමෝර් ප්‍රතිසංස්කරණ** යටතේ දේශපාලන පක්ෂ බිහි වුවද පක්ෂ ක්‍රමයක් උත්පාද නොවීය. 1931 ඩොමෝර් ප්‍රතිසංස්කරණ මගින් **සර්වජන ඡන්ද** බලය ප්‍රධානය කිරීම සමඟ ලංකාවේ දේශපාලන පක්ෂ බිහි විය. ප්‍රථම දේශපාලන පක්ෂ වන්නේ **1935** දී නිර්මාණය කළ **ලංකා සම සමාජ පක්ෂයයි.** ඩොනමෝර් ප්‍රතිසංස්කරණය තුළ විධායක කාරක සභා ක්‍රමය යටතේ ව්‍යවස්ථාදායකයේ සියලු සාමාජිකයින්ට විධායක බලතල හිමි විය. එම නිසා ආණ්ඩු බලය දිනා ගැනීමේ අරමුණින් පක්ෂ සංවිධානය නොවීම. එම නිසා එම අවධිය තුළ පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක නොවීය.

• 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය තුළ පක්ෂ ක්‍රමය ඇති වීම.
(**N.B** - *ද්වී සහාග පක්ෂ ක්‍රමයක් බව විග්‍රහ කරන්න.* )

1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයකි. මෙම ක්‍රමය තුළ විධායක බලය දිනා ගැනීම සඳහා ව්‍යවස්ථාදායකය තුළ බහුතර ආසන ප්‍රමාණයක් දිනාගත යුතු ය. එම නිසා ආණ්ඩු බලය දිනාගැනීමේ අරමුණින් පක්ෂ සංවිධාන ගත විය. එනම් පක්ෂ ක්‍රමයක් උත්පාද විය.

1946 - එක්සත් ජාතික පක්ෂය බිහි වීම.
1951 - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බිහි වීම.
ලංකා සමසමාජ පක්ෂය
කොමියුනිස්ට් පක්ෂය

මෙම ආකාරයට ආණ්ඩු බලය අත්පත් කර ගැනීම සඳහා පක්ෂ ආරම්භ විය. නමුත් සෝල්බරි ආණ්ඩුක්‍රමයේ මුල් අධියර තුළ පක්ෂ ක්‍රමය වර්ධනය වූයේ නැත.

නිදර්ශන -: 1947 පළමු පාර්ලිමේන්තුවේ ආසන 95 න් 21 ස්වාධීන මන්ත්‍රීවරුන් සතු වීම.

1947 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පිහිට වුවද පක්ෂයෙන් පිට සිටි පුද්ගලයන් පවා පසුව ආණ්ඩුවට ඇතුළත් වීම. (උදා -: පොන්නම්බලම්)

1947 - 1956 දක්වා අකණ්ඩව එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුබලය අත්පත් කර ගැනීම.

• <u>සෝල්බරි යටතේ පක්ෂ ක්‍රමයේ වර්ධනය.</u>

1956 පමණ වන විට පක්ෂ ක්‍රමය වර්ධනය විය.

නිදර්ශන -: 1956 මහ මැතිවරණය තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ මහජන එක්සත් පෙරමුණ එක්සත් ජාතික පක්ෂය පරාජයට පත් කරමින් ආණ්ඩුබලය දිනා ගත්තේ ය.

1956 වන විට ස්වාධීන මන්ත්‍රීවරු ගණන 8 දක්වා අඩු වීම.

1960 මැතිවරණය නැවත එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කිරීම.

1960 ජූලි මැතිවරණය නැවත ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ කණ්ඩායම ආණ්ඩු බලය අත්පත් කර ගැනීම.

1965 එක්සත් ජාතික පක්ෂය නැවත ආණ්ඩුබලය දිනා ගැනීම.

1970 සමගි පෙරමුණ ආණ්ඩුබලය දිනා ගැනීම.